# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය
இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்
THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA


14 වන වෙළුම, 4 වන කලාපය / 1993 ඔක්තෝබර්-දෙසැම්බර්
மலர் 14, இதழ் 4, ஒக்றோபர்-டிசம்பர் 1993
Vol: 14, No. 4 / 1993 October-December
ISSN 1391-0000






පුහුණු පාඨමාලාවේ අවස්ථාවන්
பயிற்சித்திட்ட வேளையின்போது
Workshop in progress

පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය
நூலக பேணல் நிலையத் திட்டம்
Library Conservation Centres Project
1993.10.01-04

පාඨමාලාවට සහභාගි වූවන්
பங்குபற்றியோர்
Participants



........................ ✂ ........................ මෙතැනින් වෙන් කරන්න ........................

අධ්‍යක්ෂ ........................
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ........................
තැ. පෙ. 1764, නිදහස් මාවත ........................
කොළඹ 07.

## පුස්තකාල ප්‍රවෘත්ති - දායකත්වය - 1994

01 දායකත්වය ඉල්ලුම් කරන වර්ෂය : ........................

02. එවනු ලබන දායක මුදල් ප්‍රමාණය : රුපියල් ........................ (රු........................)
(වර්ෂයක දායක මුදල රු. 100/- කි.)

03. චෙක්පත් / මුදල් ඇණවුම් අංකය : ........................

04. ප්‍රකාශනයේ පිටපත් සංඛ්‍යාව : ........................

05. ප්‍රකාශනය එවිය යුතු නිවැරදි ලිපිනය : ........................

........................

........................

06. නම : ........................

07. පුස්තකාලයාධිපතියේ හෝ දායකයාගේ අත්සන : ........................

Director
Sri Lanka National Library Services Board
P.O. Box 1764, Independence Avenue
Colombo 07.

..........................................................
..........................................................
..........................................................

## Library News - Subscription - 1994

01. The Year subscription paid for : ..........................................................................................

02. The amount paid : ..........................................................................................
(Annual subscription fee Rs. 100/=)

03. Cheque or Money order No : ..........................................................................................

04. Number of copies : ..........................................................................................

05. Address : ..........................................................................................

..........................................................................................

06. Signature : ..........................................................................................

07. Name (in block letters) : ..........................................................................................

............................................ ✂ .............................. cut here ..........................................................................................

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
තැ. පෙ. 1764
නිදහස් මාවත, කොළඹ 07.

## පුස්තකාල ප්‍රවෘත්ති දායකත්වය - 1994 වර්ෂය

1994 වර්ෂය සඳහා ඔබගේ දායකත්වය අළුත් කරවා ගැනීම සඳහා මෙයින් කාරුණිකව සිහිපත් කරමි. වාර්ෂික දායක මුදල රු. 100/- කි. ඒ සඳහා චෙක්පත්, 'සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය' නමටත්, මුදල් ඇණවුම්, 'ටොරිංටන් චතුරශ්‍රය' තැපැල් කාර්යාලයෙන් මාරු කරගැනීමටත් එවිය යුතුවේ.

මේ සමග ඇති ආකෘති පත්‍රය ඔබගේ දායකත්වය අළුත් කර ගැනීම සඳහා බව සලකන්න.

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

Sri Lanka National Library Services Board
P.O. Box 1764,
Independence Avenue
Colombo 07.

## Library News - Subscription - 1994

Please fill in the enclosed form and send it with a cheque / money order for the amount of Rs. 100/=. The cheque should be written in favour of ' Chairman, Sri Lanka National Library Services Board' and the Money order in favour of ' Torrington Square' Post Office.

Director
Sri Lanka National Library Services Board

# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය ஆரம்பம் Established 1973



**14 වන වෙළුම 4 වන කලාපය**
**1993 ඔක්තෝබර්-දෙසැම්බර්**

*සංස්කාරක උපදේශක මණ්ඩලය*
ඊශ්වරී කොරයා
සභාපති
එම්. එස්. යූ. අමරසිරි
අධ්‍යක්ෂ
එච්. එම්. ගුණරත්න බණ්ඩා
සහකාර අධ්‍යක්ෂ
ජානකී ප්‍රනාන්දු
වැඩබලන සහකාර අධ්‍යක්ෂ

*ප්‍රධාන සංස්කාරක*
එච්. එන්. පීරිස්
*විශේෂ සංස්කාරක*
ජසින්තා සෙනෙවිරත්න
*සෝදුපත් කියවීම*
යුරිකා පද්මිණී මුණසිංහ
*කවර චිත්‍රය සහ සැලසුම්*
කේ. එම්. අයි. ස්වර්ණසිංහ
*ඡායාරූප*
ප්‍රමිලා ධර්මරත්නම්

*මුද්‍රණය*
සීමාසහිත යුනයිටඩ් මර්චන්ට්ස්
කොළඹ 13.
*බෙදාහැරීම*
අලෙවි හා ප්‍රචාරණ අංශය
*ප්‍රකාශනය*
ප්‍රකාශන අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත කොළඹ 07 ශ්‍රී ලංකාව.
දුරකථනය : 687583, 698847-261
ෆැක්ස් : 941-685-201



© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1993


කලාපයක මිල රුපියල් 25.00
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් මුදල් හා තැපැල් ඇණවුම්පත්
"සභාපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය"
නමට යොමු කරන්න.


மலர் 14 இதழ் 4
ஒக்றோபர் - டிசம்பர் 1993

*பதிப்பாசிரியர் ஆலோசனைக் குழு*
ஈஸ்வரி கொறயா
தலைவர்
எம். எஸ். யு. அமரசிறி
நெறியாளர்
எச். எம். குணரத்ன பண்டா
உதவி நெறியாளர்
ஜானகி பெர்ணாண்டோ
பதில் உதவி நெறியாளர்

*பிரதம பதிப்பாசிரியர்*
எச். என். பீரிஸ்
*விசேட பதிப்பாசிரியர்*
ஜசிந்தா செனெவிரத்ன
*அச்சு சரிபார்த்தல்*
யூரிகா முனசிங்ஹ
*மேலுறைச் சித்திரம்*
கே. எம். ஐ. ஸ்வர்ணசிங்ஹ
*புகைப்படப்பிடிப்பாளர்*
பிரமிளா தர்மரட்ணம்

*அச்சகத்தார்*
யுனைட்ரெட் மேர்ச்சன்ஸ் லிமிற்ரெட்
கொழும்பு - 13.
*விநியோகிப்பாளர்*
சந்தைப்படுத்தல், விளம்பரப்படுத்தற் பிரிவு
*வெளியிடல்*
வெளியீட்டுப் பிரிவு
ஸ்ரீலங்கா தேசிய நுலகம்
ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை
சுதந்திர வழி, கொழும்பு - 7
ஸ்ரீ லங்கா.

தொலைபேசி : 687583, 698847-261
பெக்ஸ் : 941 - 685 - 201



© ஸ்ரீலங்கா தேசிய நூலகம் 1993


பிரதியின் விலை ரூபா. 25.00
ஆண்டுச் சந்தா ரூபா. 100.00
சகல காசோலைகள், தபால் கட்டளைகள்
காசுக் கட்டளைகளும்
"தலைவர்
ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை"
யின் பெயருக்கு எழுதப்பட வேண்டும்.


ON EXCHANGE
NATIONAL LIBRA...



**Volume 14 No. 4**
**October-December 1993**

***Editorial Advisory Board***
Ishvari Corea
**Chairman**
M. S. U. Amarasiri
**Director**
H. M. Gunaratne Banda
**Asst. Director**
Janaki Fernando
**Asst. Director (Actg.)**

***Editor in Chief***
H. N. Peiris
***Special Editor***
Jacintha Seneviratna
***Proof Reading***
Urika Padmini Munasinghe
***Cover & Design***
K. M. I. Swarnasinghe
***Photographer***
Pramila Tharmaratnam

***Printers***
United Merchants Ltd.
Colombo 13.
***Distributed by***
Sales and Publicity Unit

***Published by***
Publication Division
National Library of Sri Lanka
Sri Lanka National Library Services Board
Independence Avenue, Colombo 07.
Sri Lanka.
***Tel :*** 687583, 698847-261
***Fax :*** 941 - 685 - 201



© National Library of Sri Lanka 1993


Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs. 100.00

All Cheques, Postal and Money Orders should be forwarded to
**"Chairman**
**Sri Lanka National Library Services Board"**

BL 3269

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| කතුවැකිය | 2 |
| පුවත් | 3 - 4 |
| *செய்தி* | 5 |
| News | 5 - 6 |
| පුස්තකාලයාධිකාරිත්වය පිළිබඳ අදහස් කීපයක්<br>පියදාස රණසිංහ | 7 - 10 |
| User Education in Academic Libraries<br>I. Mudannayake | 11 - 13 |
| *இலங்கையில் சர்வதேச தராதர பருவ வெளியீட்டு இலக்கத் திட்ட அமுலாக்கம்*<br>*அமரா நாணாயக்கார* | 14 - 15 |
| බොලොඤ්ඤා පොත් ප්‍රදර්ශනය 1993<br>නිලමණී අබේරත්න | 16 - 18 |
| Information Storage Technologies<br>C. I. Karunanayake | 19 - 22 |
| පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන | 23 - 24 |


## කතුවැකිය

# පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය

සියවස් ගණනාවක් තිස්සේ මිනිසාගේ ඥාණ සම්භාරය අවිච්ඡින්නව පැවත ආවේ සෙල්ලිපි, මැටිපුවරු ලිපි, පැපිරස් ලේඛන, පුස්කොළ පොත් වැනි පැරණි ලේඛන මාධ්‍ය මෙන්ම මුද්‍රිත ග්‍රන්ථ ආශ්‍රයෙනි. නව තාක්ෂණය සමග මෙම දැනුම රැස්කර තැබීම සඳහා සූක්ෂම ඡායා පත්‍ර, සූක්ෂම ඡායා පට, ශබ්ද පට, පරිගණක තැටි වැනි නව මාධ්‍ය ගණනාවක් ද ඇතිවී තිබේ.

පුස්තකාල ද්‍රව්‍ය තම අවශ්‍යතාවයනට සරිලන ප්‍රමාණයට පුස්තකාලවලට ලබා ගැනීම ආරම්භයේ පටන්ම පුස්තකාලයාධිපතීන් මුහුණ පෑ විශාල ගැටළුවක් විය. පුස්තකාල ද්‍රව්‍ය සඳහා වෙන්වන මුදල් ප්‍රතිපාදන සීමිත වීම නිසාත්, ඒවායේ මිල නිරතුරුවම ඉහළ යාම නිසාත් පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීම සෑම රටකම, සෑම වර්ගයකම පුස්තකාලයාධිපතිවරුන්ට නිරතුරුවම අභියෝගයක් වේ. මෙම අභියෝගයට අමතරව තමන් සතුව පවත්නා පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම ද පුස්තකාලයාධිපතීන් මුහුණ දෙන විශාල ප්‍රශ්නයක් වී තිබේ. සෑම වර්ගයකම පාහේ පුස්තකාල ද්‍රව්‍ය ඒවා නිෂ්පාදනය වූ දා පටන්ම විවිධ හේතු කරන කොට ගෙන ක්ෂය වීම ආරම්භ කෙරේ. පාරිසරික, දේශගුණික, ජීව විද්‍යාත්මක හේතු මෙහිදී ප්‍රධාන වේ. විශේෂයෙන්ම සර්ම කලාපීය දේශගුණික රටක් වශයෙන් ලංකාවේ පුස්තකාලයාධිපතිවරු දේශගුණික හා කෘමි උවදුරුවලින් නිරතුරුවම පීඩා විඳිති. මීට අමතරව මිනිසා අතින්ම ඇතැම් අවස්ථාවල පුස්තකාල ද්‍රව්‍යවලට විශාල ව්‍යසන ඇතිවේ.

මෙම තත්ත්වයට මුහුණදීමට පසුගිය දශක කිහිපය තුළ විවිධ මාදිලියේ ක්‍රම හා උපායයන් යොදා ගන්නා ලදී. පුස්තකාල සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය යන මැයෙන් විශේෂ විෂය ක්ෂෙත්‍රයක් ද පුස්තකාල විද්‍යාව තුළ වර්ධනය වී ඇත. මුල් යුගයේ විවිධ දේශීය ඖෂධ වර්ග ආශ්‍රයෙන් තිබූ සරල සංරක්ෂණ ක්‍රම අද රසායනික බෙහෙත් යෙදීම, ධූමායනය, ලේඛන නිරාම්ලීකරනය, දේශගුණික තත්ත්වයන් පාලනය වැනි විවිධ සංකීර්ණ සංරක්ෂණ ක්‍රම දක්වා ව්‍යාප්ත වීමක් පෙනේ.

පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු ජාතික මට්ටමින් පුළුල් ලෙස පැතිරී නොතිබීම ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂෙත්‍රයේ දක්නට ඇති විශාල අඩුපාඩුවකි. ලංකාව පුරා පැතිරී ඇති විවිධ වර්ගයේ කුඩා පුස්තකාලවල මෙවැනි සංරක්ෂණ ක්‍රම ඇත්තේම නැති තරම්ය. මේ නිසා ආර්ථික අතින් දුර්වල මෙබඳු පුස්තකාලවලට සිදුවී ඇති පාඩුව ඉතා විශාලය. මෙම පසුබිම යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය දිවයින පුරා පුස්තකාලවලට සම්බන්ධ කොට සංරක්ෂණ මධ්‍යස්ථාන ඇති කරලීමේ ව්‍යාපෘතිය ජාතික පුස්තකාල සේවාවේ නව නැම්මක් ලෙස හැඳින්විය හැක. 1993 වසරේදී සංරක්ෂණ මධ්‍යස්ථාන 36 ක් ආරම්භ කර ඇති අතර, ඉදිරි වසර්වල වසරකට නව සංරක්ෂණ මධ්‍යස්ථාන 25 බැගින් ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත. සංරක්ෂණ මධ්‍යස්ථානවලට අවශ්‍ය මූලික උපකරණ, ඒවා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පුහුණුව පුස්තකාල සේවා මණ්ඩලය මගින් සැපයේ. පුස්තකාල අතර පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ උනන්දුවක් ඇති කරලීමත්, ඒ සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් හඳුන්වා දීමත්, එය වාර්ෂිකව ව්‍යාප්ත කරලීමත් පුස්තකාල කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන සැමගේ සන්තුෂ්ටියට හේතුවන අගය කළ යුතු ජාතික මෙහෙවරකි.

\- විශේෂ සංස්කාරක -

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

## ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය - 1994

පුස්තකාල සේවා මණ්ඩලය මෙහෙයවන ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය 1994 වසරේ සිට තවදුරටත් පුළුල් කෙරේ. 1984 වසරේ අරඹන ලද මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශයට පත්වන පොතක් සඳහා මෙතෙක් ලැබුණු උපරිම ආධාර මුදල රු. 25000/- කි. 1994 වසරේ සිට එය රු. 40000/- දක්වා වැඩිකර තිබේ. මෙතෙක් වසරකට නව ප්‍රකාශන 100 ක් එළි දැක්වූ අතර, 1994 වසරේ සිට එය නව ප්‍රකාශන 120 ක් දක්වා වැඩි කර ඇත.

## නව ප්‍රකාශන

නව ප්‍රකාශන මිලට ගැනීමේ ව්‍යාපෘතිය යටතේ පුස්තකාල සේවා මණ්ඩලය කතෘන්ට දෙනු ලබන අනුග්‍රහය 1994 වසරේ සිට තව දුරටත් පුළුල් කර ඇත. මේ අනුව 1993. 09. 31 දින සිට 1994. 12. 31 දක්වා කාලය තුළ පළවන නව ප්‍රකාශන පහත සඳහන් උපරිම මිල දක්වා මිලට ගැනේ.

- ශාස්ත්‍රීය ප්‍රකාශන රු. 5000
- නිර්මාණ රු. 4000
- ළමා ප්‍රකාශන රු. 1500

## සේවාස්ථ පුහුණු අවස්ථා

පුස්තකාල විද්‍යා සුදුසුකම් ලබා ඇති අය සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කෙටිකාලීන සේවාස්ථ පුහුණු අවස්ථා සීමිත සංඛ්‍යාවක් විවෘතව පවතී. මාස 01 සිට 06 දක්වා කාල සීමාවකට ජාතික පුස්තකාලයේ විවිධ අංශවල මෙම පුහුණුව ලබා ගත හැක. පුහුණුවන්නන් සඳහා දීමනාවක් ද ගෙවනු ලැබේ. භාෂා ප්‍රවීනත්වය මෙහිදී විශේෂයෙන් සලකා බැලේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ජාතික පුස්තකාලයේ අධ්‍යාපන හා පුහුණු අංශය වෙතින් ලබා ගත හැක.

## ශ්‍රී ලංකා පුවත්පත් අනුක්‍රමණිකාව

'ශ්‍රී ලංකා පුවත්පත් අනුක්‍රමණිකාව' සම්පාදනය කිරීමේ නව ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1994 වසරේ ආරම්භ කෙරේ. ජාතික මට්ටමේ පුවත්පත් අනුක්‍රමණිකාවක් නොමැතිවීම දැනට මෙම ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන විශාල අඩුපාඩුවක් වේ. මෙහි මූලික පියවර වශයෙන් දැනට ලංකාවේ විවිධ ආයතන විසින් පළ කරනු ලබන විවිධ විෂය ක්ෂේත්‍රවලට අයත් පුවත්පත් අනුක්‍රමණිකා පිළිබඳ ගවේෂණයක් මෑතකදී ජාතික පුස්තකාලයේ ප්‍රලේඛණ සේවා අංශය මගින් සිදුකර ඇත. ප්‍රධාන ජාතික පුවත්පත් ආවරණය කරන ශ්‍රී ලංකා පුවත්පත් අනුක්‍රමණිකාවේ පළමු කලාපය මේ වසර තුළදී නිකුත් කිරීමට සැලසුම් කර තිබේ.

# පුවත්

## ජාතික පුස්තකාලයේ කටයුතු පරිගණක ගත වේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කටයුතු පරිගණක ගත කරලීම දැනට ආරම්භ කර ඇත. මෙම කාර්යයන් සඳහා විඥාපන තාක්ෂණ අංශය නමින් විශේෂ අංශයක් ද පිහිටුවා ඇති අතර, මෙම කටයුතු සඳහා ලංකාවේ ප්‍රවීණ පරිගණක විශේෂඥයකුගේ සහාය ද ලබා ගැනේ. 93.06.01 වන දින සිට ජාතික පුස්තකාලයේ සියළුම සුචි පත්‍රිකා, කාඩ්පත් සුචියට අමතරව පරිගණක සුචියට ද ඇතුළත් කෙරෙමින් පවතී. 1994 වසරේ සිට ප්‍රධාන ජාතික පුස්තකාල සුචිය පරිගණක ගත කිරීමේ කටයුතු ද ආරම්භ කෙරේ. ජාතික පුස්තකාලයේ අනිකුත් ප්‍රධාන අංශ වන ජාතික ග්‍රන්ථ නාමාවලි අංශය, ප්‍රතිග්‍රහණ අංශය, ආයතන හා මුදල් අංශවල කටයුතු ද පළමු අදියරේදී පරිගණක ගත කෙරෙනු ඇත.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය නව මුහුණුවරකින්

1994 වසරේ ජනවාරි මස සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය මාසිකව නිකුත් කෙරේ. ඒ අනුව සෑම මාසයකටම අදාළ ජාතික ග්‍රන්ථ නාමාවලි පිටපත ඊට පසු මාසයේදී නිකුත් වේ. 1962 වසරේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කරලීමේ කාර්යය 1974 වසරේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය භාරයට පැවරුණි. මෙම මහා ජාතික ප්‍රකාශනය පළ කිරීමේදී මෙතෙක් පැවති ගැටළුව වූයේ එය කාලීන නොවීමය. පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් මෙම ප්‍රකාශනය බොහෝ දුරට කාලීන කර ඇති අතර, දැනට 1993 වසර දක්වා කලාප ප්‍රකාශනයෙන් නිකුත් වී තිබේ. 1993 වසරේ කලාප ද ඉදිරි මාස කිහිපය තුළ එළි දැක්වේ. නීතිමය තැන්පතු ක්‍රමය යටතේ ජාතික පුස්තකාලයට ලැබෙන ප්‍රකාශන ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රධාන මූලාශ්‍රය වන අතර, පසුගිය වසර කිහිපය තුළ මීට අමතරව ප්‍රකාශකයින්ගෙන් ලබා ගන්නා තොරතුරු, ජාතික පුස්තකාලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ ලබා ගන්නා ප්‍රකාශනවල තොරතුරු, අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය යටතේ ලබා ගන්නා ප්‍රකාශනවල තොරතුරු සහ ජාතික පුස්තකාලය මිලදී ගන්නා ප්‍රකාශනවල තොරතුරු ද ඇතුළත් කොට ජාතික ග්‍රන්ථ නාමාවලිය වඩාත් පුළුල් කර ඇත. මීට අමතරව ඉදිරියට පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ද ඇතුළත්වීම නිසා ද ජාතික ග්‍රන්ථ නාමාවලියේ අගය තවත් පුළුල් වී ඇත. 1994 වසරේ

සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය මාසිකව ප්‍රකාශනය වීම ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලීකරණයේ වැදගත් සන්ධිස්ථානයක් ලකුණු කරයි.

## පොත් ප්‍රදර්ශන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1993 වසරේ අවසාන භාගයේ පොත් ප්‍රදර්ශන ගණනාවක් පවත්වන ලදී.

- දැරණියගල සිරි සමන් මධ්‍ය මහා විද්‍යාලය (1993.10.29 - 30)
- විගණකාධිපති දෙපාර්තමේන්තුව (1993.11.25)
- ජාතික තරුණ සේවා සභාව, මහරගම (1993.12.26 - 29)
- 'සියනෑ 93' ප්‍රදර්ශනය, කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලය (1993.12.18 - 26)

1994 වසරේදී ලංකාවේ සෑම පළාතකම ප්‍රධාන නගරවල ප්‍රදර්ශන මාලාවක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සැලසුම් කර ඇත.

## මහජන පුස්තකාලයේ ළමා උළෙලක්

මොණරාගල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය ළමයින් සඳහා විවිධ තරඟ පවත්වා, එම තරඟවලින් ජයලද්දන්ට තෑගි හා සහතිකපත් බෙදාදීමේ උත්සවයක් 1993 ඔක්තෝම්බර් මස 01 වැනි දින පවත්වන ලදී. මෙම තරඟ හා උත්සවය ප්‍රාදේශීය සභා කමිටුව විසින් සංවිධානය කළ අතර, එම උත්සවය මොණරාගල ප්‍රජා ශාලාවේදී ප්‍රාදේශීය සභාවේ සභාපති ජේ. ඊ. ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

## විවෘත කිරීම්

කැළණිය මානෙල්ගම නව මහජන පුස්තකාල ගොඩනැගිල්ල පළාත් සභා අමාත්‍ය ජෝන් අමරතුංග මහතා අතින් 1993.12.31 වන දින විවෘත විය. මෙම පුස්තකාලයට පොත් හා පුස්තකාල දැව උපකරණ පරිත්‍යාග කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් සිදුවුණි.

## පුස්තකාල සම්පත් බෙදාදීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ස්වේච්ඡා පදනමින් නව ගොඩනැගිලි ඉදි කරනු ලබන පුස්තකාල සඳහා දැව උපකරණ කට්ටල පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරයි. මේ යටතේ නව ගොඩනැගිලි ඉදිකරණ ලද පාසල්, මහජන හා පිරිවෙන් පුස්තකාල තිස්පහක් සඳහා දැව උපකරණ කට්ටල ප්‍රදානය කිරීමේ උත්සවයක් 1993 ඔක්තෝබර් මස 04 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේදී ගුරු අධ්‍යාපන සේවා අමාත්‍ය සුනේත්‍රා රණසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

## දැව උපකරණ පරිත්‍යාග ලද පුස්තකාල නාම ලේඛණය

01. ශ්‍රී මේධානන්ද අනුස්මරණ පුස්තකාලය ශ්‍රී විවේකාරාමය - අළුකැටිය, මාවුවාවල- කිරිඇල්ල
02. අම්/දෙහි/වෙරගල මහා විද්‍යාලය - අරලගන්විල
03. ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරය - කළුබෝවිල- දෙහිවල
04. මානෙල්ගම මහජන පුස්තකාලය - කැළණිය ප්‍රාදේශීය සභාව, මහර-කඩවත
05. කුලි/නෙත්තිපොල ගෙදර මහ විදුහල - කුලියාපිටිය
06. ලයනල් ජයතිලක අනුස්මරණ පුස්තකාලය - කුලියාපිටිය ප්‍රාදේශීය සභාව, කුලියාපිටිය
07. ඊරියගොල්ල මහජන පුස්තකාලය - කුලියාපිටිය
08. නික/පුබ්බිලිය මහා විද්‍යාලය - කොබෙයිගනේ
09. මො/ගලබැද්ද මහා විද්‍යාලය - ගලබැද්ද- මොණරාගල
10. ගා/පිටදෙණිය මහා විද්‍යාලය - ගොනාමුල්ල හන්දිය
11. කෑ/දෙහි/තල්දුව මහා විද්‍යාලය - තල්දුව- අවිස්සාවේල්ල
12. රාජකීය විද්‍යාලෝක මහා විද්‍යාලය - ත්‍රිකුණාමලය
13. වාළුකාරාම පුරාණ විහාරය - දඩල්ල - ගිංතොට
14. ක/හොරවල මහා විදුහල - දොඩංගොඩ
15. ශ්‍රී ධාතුමළු විහාරය - නුගේගොඩ
16. නු/උගේ/පල්ලේබෝවල පර්ෂද විදුහල - පල්ලේබෝවල
17. සිරි පියරත්න මහා විද්‍යාලය - පාදුක්ක
18. නික/කොබෙයිගනේ ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය - ප්‍රාදේශීය සභාව- කොබෙයිගනේ
19. ර/ගැටඅරළුව විදුහල - බලංගොඩ
20. ර/බලංගොඩ කණිටු විදුහල - බලංගොඩ
21. ඇතුන්ගහකොටුව මහජන පුස්තකාලය - බිංගිරිය ප්‍රාදේශීය සභාව - බිංගිරිය
22. හ/අගුල්මඩුව කණිටු විදුහල - බෙලිඅත්ත
23. වා/පඩු/කඹුරාපොල ආදර්ශ කණිටු විදුහල - මුණමල්දෙණිය
24. කෑ/දෙහි/මාලිබොඩ ශ්‍රී දේවානන්ද කණිටු විදුහල - මාලිබොඩ
25. රඹෑව මහජන පුස්තකාලය - රඹෑව ප්‍රාදේශීය සභාව - රඹෑව
26. ර/වලගම්බා මහ විදුහල - වැලිගෙපොල- බලංගොඩ
27. ර/බටේවෙල කණිෂ්ඨ විද්‍යාලය - වේවැල්වත්ත - රත්නපුර
28. ජනාධිපති විද්‍යාලය - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
29. හ/උඩයාල විදුහල - හකුරුවෙල
30. මාර/නරවැල්පිට උතුර කනිටු විදුහල - හක්මන
31. මහජන පුස්තකාලය වැලිගෙපොල - හුණුවල, ඕපනායක ප්‍රාදේශීය සභාව
32. ර/හුණුවල ධර්මරාජ මහ විදුහල - හුණුවල, ඕපනායක
33. මා/නාමිණිඔය මහා විද්‍යාලය - හෙට්ටිපොල - විල්ගමුව
34. නික/තෙලහැර මහා විද්‍යාලය - හෙන්ගමුව - කොබෙයිගනේ
35. ගම්/මිනු/වේරගොඩ මහා විද්‍යාලය - හොරම්පැල්ල

# செய்தி

## 25,000 ரூபாவிற்கு பதிலாக 40,000 ரூபா

நூல் வெளியீட்டாளர் உதவித் திட்டத்தின் கீழ் நூல் ஒன்றை வெளியிடுவதற்காக வழங்கப்பட்டு வந்த 25,000 ரூபா உதவிப் பணத்தை 1994ம் ஆண்டு முதல் ரூபா 40,000 மாக அதிகரிப்பதற்கு இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை ஏற்பாடு செய்துள்ளது. இதன் பிரகாரம் இத்திட்டத்தின் கீழ் வெளியிடப்படும் நூல் ஒன்றின் 1000 பிரதிகளுக்கு மேற்படாமல் கொள்வனவு செய்வதுடன், ரூபா 40,000 க்கு மேற்படாத தொகையை எழுத்தாளர்களுக்கு வழங்குவதற்கும் ஒழுங்கு செய்யப்பட்டுள்ளது. 1994ம் ஆண்டிற்காக கையெழுத்துப் பிரதிகளை வழங்கியுள்ளவர்களுக்கும் இவ்வுதவி வழங்கப்படும்.

## புதிய வெளியீடுகளுக்கான உதவித் தொகையை அதிகரித்தல்

இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையானது புதிய வெளியீடுகளைக் கொள்வனவு செய்யும் திட்டத்தை 1994ம் ஆண்டில் இருந்து விரிவாக்கியுள்ளது. வெளியீடு களின் வகைகளும், அவற்றின் கொள்வனவின் பொருட்டு வழங்கப்படும் உச்ச பெறுமதியும் கீழே தரப்பட்டுள்ளது.

| | | |
|---|---|---|
| ஆராய்ச்சி நூல்கள் | - | ரூ. 5,000.00 |
| ஆக்க இலக்கியங்கள் | - | ரூ. 4,000.00 |
| சிறுவர் நூல்கள் | - | ரூ. 1,500.00 |

1993 ஒக்டோபர் 1ம் திகதியில் இருந்து 1994 டிசெம்பர் 31ம் திகதி வரையிலான காலப் பகுதியில் வெளியிடப்பட்ட நூல்கள் மேற் குறிப்பிடப்பட்ட பெறுமதி களுக்குப் பெற்றுக் கொள்ளப்படும். சஞ்சிகைகளின் முதல் வெளியீட்டிற்கு மட்டும் இந்த உதவி வழங்கப்படும்.

## நூலக வளங்கள் வழங்குதல்

இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையானது தாமாகவே புதிய நூலகக் கட்டிடங்களை அமைத்துக் கொள்ளும் நூலகங்களுக்கு மரத் தளபாடங்களின் தொகுதியொன்றை அன்பளிப்புச் செய்வதை நடைமுறைப்படுத்துகின்றது. இத்திட்டத்தின் கீழ் புதிய கட்டிடங்களை நிர்மாணித்த 35 பாடசாலை, பொது, மடாலய நூலகங்களுக்கு மரத் தளபாடங்களை பகிர்ந்தளிக்கும் வைபவமானது 1993 ஒக்ரோபர் மாதம் 04ம் திகதி இலங்கைத் தேசிய நூலகத்தில் கௌரவ கல்விச் சேவைகள் அமைச்சரின் தலைமயின்கீழ் நடைபெற்றது.

## வடமேல் மாகாண பொது நூலகர்களைப் பயிற்றுவித்தல்

இலங்கைத் தேசிய நூலகமும் வடமேல் மாகாண மாகாண சபையும் இணைந்து புத்தளம், சிலாபம் ஆகிய பிரதேசங்களில் சேவை செய்யும் பொது நூலக நூலகர்களிற்கும், நூலக உதவியாளர்களிற்கும் இரண்டு நாட் பயிற்சி நெறியொன்றை 1993 நொவம்பர் 20, 21ம் திகதிகளில், நாத்தாண்டிய, அல்பட் எஸ். பீரிஸ் ஞாபகார்த்த மண்டபத்தில் நடத்தின.

# NEWS

## BOOK EXHIBITION

The SLNLSB held the following exhibitions during the last quarter of 1993.

- Siri Saman Vidyalaya, Deraniyagala, (29th & 30th October)
- Auditor General's Department, (25th November)
- National Youth Services Council, Maharagama (26th to 29th November)
- "Siyane - 93" Exhibition at Kirindiwela Madya Maha Vidyalaya (18th to 26th December)

The SLNLSB has planned to hold a series of book exhibitions and sales centres throughout the island in 1994.

## PUBLICATIONS ASSISTANCE PROJECT

The SLNLSB intends to expand the 'Publications Assistance Project' from 1994. At present a maximum sum of Rs. 25,000/- is paid to an author to publish a book under this project and the assistance is limited to 100 publications. From 1994 this amount will go up to Rs. 40,000/- and the publications to 120 titles respectively.

## SRI LANKA NEWSPAPER INDEX

The National Library is planning to compile "The Sri Lanka Newspaper Index" from 1994. This will fulfill a long felt need in this field.

## IN-SERVICE TRAINING

A limited number of places are available at the National Library for in-service training for those who have basic library qualifications. The training period vary from 1 to 6 months period. A small allowance is also given to the trainees. For further details contact Head, Education & Training Division.

## SRI LANKA NATIONAL BIBLIOGRAPHY - MONTHLY

The Sri Lanka National Bibliography (SLNB) will be published monthly from January 1994. At present all the issues up to 1993 have been published. The 1993 issues will be published shortly.

## EUROPEAN DIRECTORY OF ACID-FREE AND PERMANENT PAPER

A Europeon Directory of Acid-Free and Permanent Paper has been published by the European Foundation for Library Cooperation / Group de Lausanne on behalf of the European Commission. It lists the characteristics of more than 100 types of permanent paper produced by 37 manufacturers in 14 European countries. According to specialists, more than one billion books in libraries are self-destructing due to the acidity of the paper on which they are printed. The Directory is free (while supplies last) and can be obtained by writing to the EFL/Groupe de Lausanne, Chemindes Vieux Amis 17, B-1380 Lasne, Brussels, Belgium.

## THE LIBRARY FELLOWS PROGRAM

Funded by the U. S. Information Agency (USIA) and administered by the American Library Association (ALA), the Library Fellows Program was initiated in October 1986 to place U. S. library professionals in institutions overseas for periods of several months to one year. The program's purpose is threefold:

- to increase international understanding through the establishment of professional and personal relationships and the accomplishment of mutual goals;

- to promote international sharing of resources and to increase access to U. S. materials in the host country;

- to enable U. S. librarians to enrich and broaden their career experiences through a short period of overseas service.

Fellows are sent around the globe to work on projects such as developing a universitylevel library science curriculum, setting up a system for automating library functions, and developing and promoting American studies collections in host countries. Other work has included organizing a national archival collection, and training host country librarians in traditional and automated information retrieval techniques.

Institutions interested in hosting Library Fellow should contact the Public Affairs Officer or the Cultural Affairs Office at the United States Embassy.

## IFLA PROFESSIONAL REPORTS

No. 25. Guidelines for Children's Services. By Adele M. Fasick under the auspices of the IFLA section for School Libraries, IFLA Headquarters, 1991. ISBN 90-70916-29-0.

No. 35. Mobile Libraries in the World Community 1980-1992: An Annotated Bibliography. By Thelma H. Tate Under the auspices of the IFLA Round Table on Mobile Libraries, 1992. ISBN 90-70916-43-6.

No. 17. Managing School Libraries. By Anne M. Galler and Joan M. Coulter. IFLA Headquarters, 1989. ISBN 90-70916-21-5.

No. 24. Guidelines for Library Services to Deaf People. IFLA Headquarters. 1991. ISBN 90-70916-28-2. Edited by John M. Day of the IFLA section for Libraries Serving Disadvanted Persons.

No. 28. Mobile Library Guidelines. By Robert Pestell under the auspices of the IFLA Round Table on Mobile Libraries. IFLA Headquarters. 1991. ISBN 90-70916-33-9.

No. 34. Guidelines for Library Services to Prisoners. Edited by Frances E. Kaiser under the auspices of the Section of Libraries Serving Disadvantaged Persons, 1992. ISBN 90-70916-42-8.

## SEMINAR ON INTERNATIONAL STANDARD SERIAL NUMBERING (ISSN)

A seminar for Publishers on International Standard Serial Numbering (ISSN) was held at the National Library on the 25th of November 1993. The purpose of this seminar is to inaugurate the ISSN system Sri Lanka. Over fifty publishers and librarians attended the seminar, where the project was explained and the publishers were enlightened on modalities of implementation. The National Library of Sri Lanka functions as the National ISSN Centre in Sri Lanka.

## BOOK PRESERVATION PROGRAMME

A four day training programme in book binding and preservation was held at the Sri Lanka National Library Services Board recently. Thirty five book binders from selected public libraries in the country have attended this training programme. The Sri Lanka National Library Services Board has also donated book binding equipment to all participating libraries at the end of the course.

# පුස්තකාලයාධිකාරිත්වය පිළිබඳ අදහස් කීපයක්

**පියදාස රණසිංහ**
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි
කැළණිය විශ්වවිද්‍යාලය

තිරන්තර ඥාන පිපාසය මානව වර්ගයාට පමණක් උරුම වූ එක් සුවිශේෂ චරිත ලක්ෂණයකි. ඒ පිපාසය සංසිඳුවන්නට විසඳුම් වශයෙන් ඔහු සොයාගත් හැම දෙයක්ම-අක්ෂර ලේඛන කලාව, විවිධ ලේඛන ද්‍රව්‍ය හා චින්තන වාර්තා මාධ්‍ය - නැවත නැවතත් ඒ පිපාසය උග්‍ර කරන්නට හේතු වී තිබේ.

මිනිසා විසින් පුස්තකාල ආරම්භ කරන ලද්දේ මේ දීර්ඝ ඥාන ගවේෂණ යාත්‍රාවේදී තමනට පිහිට වන ක්ෂේම භූමි ලෙසිනි. ඥාන ගවේෂීන්ගේ ප්‍රයෝජනය උදෙසා පොත් සහ වෙනත් වාර්තා ආරක්ෂා කොට තැබීමේ ඉතිහාසය පාණ්ඩිත්‍යය හෙවත් අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසයේ ඉතා වැදගත් එක් අංගයක් ලෙස සැලකිණි. පාණ්ඩිත්‍ය සම්ප්‍රදාය පරපුරින් පරපුරට පවත්වා ගෙන එන ලද්දේ පුස්තකාල විසිනි. පුස්තකාලවල වර්ධනය හා පරිහානිය හැමවිටම අධ්‍යාපනයේ වර්ධනය හා පරිහානිය සමඟ අත්වැල් බැඳ ගත්තක් බව ද පෙනේ.[1]

අතීතයේදී රාජකීයයනට හා පූජකයනට පමණක් සීමා වී තිබූ දැනුම හෙවත් පාණ්ඩිත්‍යය, 15 වැනි සියවසේ සිට ඇරඹුණු මුද්‍රණ ශිල්පයේ ප්‍රවර්ධනයත් සමඟ පොදු ජනතාව අතරට පැමිණීමෙන් අනතුරුව සමාජායතනයක් ලෙස පුස්තකාලයේ අගය බෙහෙවින් වැඩිවිණි. ආරම්භක අවධිවල හුදෙක් සංරක්ෂකයකු හා භාරකරුවකු පමණක් වූ පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය ද මේ සමඟම වෙනස් වී තිබේ. වාර්තා ගත මානව ඥානය රැස් කිරීම, සංරක්ෂණය, සංවිධානය හා උපයෝජකයන්ගේ ප්‍රයෝජනය පිණිස ලබා දීම යන මූලික මෙහෙයයන් වර්තමාන පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරයට අයත් වේ.

පුස්තකාලයාධිකාරිත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යයන් හා ගති ලක්ෂණයි. පාණ්ඩිත්‍යය විසින් පඬිවරුනගේ ගති ලක්ෂණ විදහාපාන්නේ යම් සේ ද, පුස්තකාලයාධිකාරිත්වය ද පුස්තකාලයාධිපතීන්ගේ ගති ලක්ෂණ හා කාර්යයන් ගෙන හැරපායි.[2]

පුස්තකාලයාධිකාරිත්වයේ ඉතිහාසය ද පුස්තකාල ඉතිහාසය හා සමගාමීය. ජේම්ස් තොම්සන් දක්වන අයුරු පුස්තකාලය ඉතා බලවත් ආයතනයකි. සංස්කෘතිය ආරක්ෂා කිරීම, සන්නිවේදනය, අධ්‍යාපනය, විනෝදය, සමාජ හා දේශපාලන පරිවර්තනය, නිදහස් චින්තනය බඳු විවිධාංශවලදී පුස්තකාලය විසින් ප්‍රදර්ශනය කරනු ලබන බලය විශිෂ්ටය. එතකුදු වුවත්, සියවස් ගණනාවක් ගත වීමෙන් ඉක්බිතිව පවා මේ කිසිදු බලයක් පිළිබිඹු කිරීමට පුස්තකාල වෘත්තීය අසමත් වී සිටී. සැබැවින්ම රාජ්‍ය හෝ ජාතික හෝ මට්ටමින් තමන් 'වෘත්තීයමය' තත්ත්වයක සිටින බවවත් ඔප්පු කිරීමට තවමත් පුස්තකාලයාධිපතිවරුනට හැකි වී නැත. 'වෘත්තීය' යන්න නිර්වචනය කරන එන්සල් සමීක්ෂණය අනුව වෘත්තීයක සාමාජිකයන් ලෙස හැඳින්වෙන්නේ කණ්ඩායමක් වශයෙන් යම් විශේෂ ගුණ සතුව සිටී යැයි පෙනෙන, කණ්ඩායමක් වශයෙන් බලය පැවරීමට මහජනයාට හැකි වන හා මහජනයා කෙරෙහි කණ්ඩායමක් වශයෙන් බලපෑමක් කළ හැකි අයයි. මේ නිර්වචනය පිළිගත හොත් ස්වකීය වෘත්තීය රාජ්‍ය හෝ ජාතික මට්ටමින් ප්‍රතිග්‍රහිත තත්ත්වයකට පත් කරන්නට පුස්තකාලයාධිපතිවරුන් සමත්ව සිටින්නේ ද යන්න ශංකා පරවශය.[3]

යථාර්ථය මෙය නම් එය කිසිසේත් ම හිතකර හෝ සතුටුදායක හෝ තත්ත්වයක් නොවේ. එහෙයින් නොපමාව ම පුස්තකාලයාධිකාරිත්වය ද පුස්තකාලය මෙන් ම බලවත් සංස්ථාවක් බවට පත් කිරීම අප සතු වගකීමකි. මේ ලිපියේ අරමුණ වන්නේ පුස්තකාලයාධිකාරිත්වය අප්‍රතිග්‍රහිත වෘත්තියක් බවට පත්වීමට තුඩු දුන් හේතු සමහරක් සැකෙවින් විමසා බැලීමයි.

ආරම්භයේ පටන් ම පුස්තකාලය නැමැති ආයතනය, පුස්තකාලයාධිපතිවරයා හෙවත් පුස්තකාල වෘත්තීය යටපත් කොට ගෙන වර්ධනය වීම, බොහෝ දෙනාගේ අවධානයට හසු නොවෙතත් මේ තත්වයට තුඩු දුන් එක් ඓතිහාසික හේතුවක් බව පෙනේ. ප්‍රතිග්‍රහිත අනෙක් කිසිදු වෘත්තියක දී මෙබඳු වැරදීමක් සිදු වී නැත. වෛද්‍ය විද්‍යාව වෛද්‍යවරයා මූලික කොට ගෙන, කේන්ද්‍ර කොට ගෙන වර්ධනය විය. වෘත්තීය යටපත් කොට ගෙන ශාස්ත්‍රය වර්ධනයවීමත් එහිදී සිදුවී නැත. ව්‍යාපාර කළමනාකරණය, ඒ වෘත්තීය පාදක කොට ගෙන දියුණු වූවා මිස, එය යටපත් කොට ගෙන වැඩුණක් නොවේ. එහෙත් ඓතිහාසික නයින් විමසන විට අපට ඉතා පැහැදිලිව පෙනී යන කරුණක් නම් පුස්තකාල පුස්තකාලයාධිපතීන් විසින් අරඹා සංවර්ධනය කරන ලද ඒවා නොවන බවයි. පෞරාණික පුස්තකාල හැමෙකක් ම බිහිවූයේ ඒ ඒ වකවානුවල රාජ්‍ය විචාල ශාස්ත්‍ර ලෝලී රාජාධිරාජයන්ගේ මැදිහත්වීම හා අනුග්‍රහය මතය. වර්තමානයේ වුවද රාජ්‍යානුග්‍රහයෙන් තොරව පුස්තකාලයක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම දුෂ්කරය. මෙබඳු තත්වයක දී පුස්තකාලයාධිපතිවරයාට අනිවාර්යයෙන්ම ද්විතීය ස්ථානයක් හිමිවීම නොවැලැක්විය හැකිය. මුල් වකවානුවලදී ඔහු අන්‍යතර ප්‍රබලයකු විසින් සංස්ථාපනය කරන ලද ආයතනයක සම්පත් ආරක්ෂා කිරීම භාරව සිටි හුදු ගබඩා භාරකරුවෙක් විය. රැස් කළයුතු සම්පත් මොනවාදැයි තීරණය කිරීම ඔහුට අයත් කාර්යයක් නොවීය. රාජකීයයන්, පූජකයන් හෝ සෙසු විදග්ධයන් විසින් සපයා දුන් දෑ සුරැකීම පමණි ඔහුගේ වගකීම වූයේ. ලෙයිඩන් පුස්තකාලයේ භාරකරු වූ හෙයින්සියස් විසින් කියන ලද්දේ යැයි රොබර්ට් බර්ටන් උපුටා දක්වන යට දැක්වෙන ප්‍රකාශයෙන් ආදී පුස්තකාලයාධිකාරිත්වයේ ආකල්පය මැනවින් වටහා ගත හැකිය. 'පුස්තකාලයට පැමිණි විගසම

මම අඥාන භාවයේ මාතාව වූ අලස බව විසින් පෝෂණය කරනු ලබන රාගය, විජිගීෂාව, ධන තෘෂ්ණාව ආදී සකල දුෂ්චරිත බැහැර කරමින් එහි දොර වසා ගනිමි. .......... අනතුරුව සදාකාලිකත්වයේ තුරුලෙහි, අප්‍රමාණ වූ දිව්‍යාත්මයන් අතර, උද්දාම වූ ආත්මයත් සහිතව මිහිරි වූ තෘප්තිමත් හැඟුමකින් වෙළෙමින් මගේ අසුනේ හිඳ ගන්නා මම මේ සන්තෝෂය ගැන නොදන්නා අයගේ සියලුම ශ්‍රේෂ්ඨයන් හා ධනවත් පුද්ගලයන් ගැන අනුකම්පා කරමි". [4]

බාහිර ලෝකයෙන් වෙන් වී ගබඩා කාමරයක සිරවූ, හුදකලා භාරකරුවකුගේ මෙබඳු හුදකලා ආකල්පයක් යටතේ පුද්ගලයා සහ ඔහුගේ වෘත්තීය යටපත් කොට ගෙන ආයතනය පමණක් වර්ධනය වීම පුදුමයට කරුණක් නොවේ. පුදුමයට හේතුව නම් මේ කරුණ පශ්චාත් කාලීනයන් විසින් ද යථාරූපීව වටහා නොගැනීමයි.

වත්මන් පුස්තකාලයාධිපතිවරයා හෙයින්සියස් මෙන් ගබඩා භාරකරුවකු නොවුණ ද හෙයින්සියස් ගේ 'හුදකලා ප්‍රිය භාවය' තාමත් ඔහුගේ/ඇයගේ මනසේ ද රැඳී තිබේ. පුස්තකාලය බාහිර ලෝකයේ රළු පරළු අවුලින් මිදුණු, නිහඬ ක්ෂේම භූමියක් ලෙස තබා ගන්නට ඔහු තාමත් තැත් කරයි. ඈන් මැක්ම-හෝන් විසින් පුස්තකාලයාධිපතීන්ගේ පෞරුෂත්වය පිළිබඳව කරන ලද අධ්‍යයනයක දී පුස්තකාලයාධිපතීන් සංවේදී, සිත් තැවුලට නැඹුරු වූ, මදක් ප්‍රමාණය ඉක්මවා පාලනය වූ හා අනාරක්ෂිත පිරිසක් බව ද, පුස්තකාලයාධිපතිනියන් සංවේදී, පරමාදර්ශී, සමාජයෙන් වෙන් වූ, තරමක් විෂාදී (depressed) අනාරක්ෂිත පිරිසක් බවද මේ දෙපක්ෂයම ආර්ථිකමය වටිනාකම්වලට වඩා සෞන්දර්යාත්මක වටිනාකම්වලට ඉහළ ප්‍රමුඛත්වයක් දෙන බව ද හෙළි කොට තිබේ. [5]

වෘත්තීයක අභිවර්ධනය සඳහා වෘත්තිකයන්ගේ ආකල්ප ප්‍රවේගශීලී වුව මනාය. නොඑසේ නම් වෘත්තීය ඉක්මවා ආයතනය වර්ධනය වීම අනිවාර්යය.

පුස්තකාලය බලවත්, වැදගත් සමාජායතනයක් බව හැම දෙනාම පාහේ පිළිගනිති. එහෙත් එය හුදු සාම්ප්‍රදායික පිළිගැනීමක් පමණි. එබඳු පොදු පිළිගැනීමකින් පමණක් වෘත්තීය අභිවර්ධනයක් සිදු නොවේ. රෝහල් ඉතා ප්‍රයෝජනවත් සමාජායතන බව පොදු පිළිගැනීමයි. එහෙත් එපමණකින් වෛද්‍ය වෘත්තියේ ප්‍රගමනයක් සිදු නොවේ. ඒ පොදු පිළිගැනීමේ අර්ථවත් භාවය ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වශයෙන් ද වෛද්‍යවරුන් විසින් සමාජයට ඒත්තු ගන්වන ලද්දේ නම් පමණි, ඉන් වෘත්තීය සංවර්ධනයට වැඩක් සිදුවන්නේ. පුස්තකාල සේවාව සම්බන්ධ තත්ත්වය ද මේ මැයි. ඊට පොදු සමාජ පිළිගැනීමක් ඇතත් පුස්තකාලයාධිපතිවරු තාමත් එතරම් සමාජ පිළිගැනීමක් නැති, අනෙක් වෘත්තීන් හා සසඳන විට අඩු වැටුප් ලබන පිරිසක් වෙති. ඒ ඒ වෘත්තීන් සම්බන්ධ සමාජ තත්ත්වයේ ප්‍රමාණය විමසා බැලීම පිණිස කොන්ගැල්ටන් (ඕස්ට්‍රේලියාව) විසින් කරන ලද සමීක්ෂණයකදී පෙනී ගියේ, සමීක්ෂිත වෘත්තීයමය රැකියා 22 අතුරින් පුස්තකාලයාධිපතිත්වය 19 වැනි තැනට පැමිණියත් වෙනත් රැකියාවන් හා සසඳන විට එය 38 වැනි ස්ථානය දක්වා පහළ වැටුණු බවයි. ඒ අනුව පුස්තකාලයාධිපතිවරයකුගේ සමාජ තත්ත්වය සමාන වූයේ හොඳින් තහවුරු වූ කිරි පට්ටි හිමියකුගේ තත්ත්වයටය.[6]

තම ආයතනයට ලැබී ඇති පොදු සමාජ පිළිගැනීම, ස්වකීය ක්‍රියා මාර්ගය තුළින් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව තහවුරු කිරීමෙන් මිස අන් කිසිදු අයුරකින් ස්වකීය වෘත්තියේ අභිවර්ධනයක් පුස්තකාලයාධිපතීන්ට අපේක්ෂා කළ නොහැකිය.

ඔවුන් විසින් පුස්තකාලය නැතිවම බැරි සමාජ සංස්ථාවක් බවට පත් කළ යුතුය. පුස්තකාලය විදග්ධයාගේ පටන් නූගතා දක්වා වන හැම සමාජ ස්තරයකම ඥාන ගවේෂණ අවශ්‍යතා, තොරතුරු අවශ්‍යතා සපයා දීමට පෙරමුණ ගත් සකල විධ සන්නිවේදන මාර්ග රාශිගත කොට ගත් විශිෂ්ටතම සන්නිවේදකයා වුවහොත් පුස්තකාලයාධිපතිවරයාද සමාජයට නැතිවම බැරි වෘත්තිකයෙක් වනු නිසැකය.

ප්‍රමාණවත් අරමුදල් රහිතව ස්වකීය ආයතන දියුණු කරන්නේ කෙසේ දැයි පුස්තකාලයාධිපතිවරු නිරතුරුව මැසිවිලි නගති. පුස්තකාලයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ප්‍රමාණාත්මක විනිශ්චයක් කිරීමට රජය හෝ අදාළ බලධාරී ආයතන අසමත්වීම අරමුදල් ගැටළුවට ප්‍රධානතම හේතුවයි. වෙස්ට් වර්ජිනියා සරසවියේ පශ්චාද් උපාධි පීඨයෙහි පීඨාධිපති රොබර්ට් එෆ්. මන්, වරක් විශ්වවිද්‍යාල පුස්තකාල හා විශ්වවිද්‍යාල පරිපාලනය අතර පවත්නා සම්බන්ධතාව විග්‍රහ කරමින් මෙසේ කීය. "එක් වැදගත් කරුණක් නම් බොහෝ අධ්‍යාපන පරිපාලකයන් පුස්තකාලය පල්ල නැති මල්ලක් සේ දැකීමයි. එක් වසරක දී වැඩි කළ අරමුදල් ඊළඟ වසරේදී නිසැකවම තවත් විශාල ඉල්ලීම් රැසකට හේතු වන බව ඔවුහු දනිති. වඩා වැදගත් කරුණ නම් පුස්තකාලයක අවශ්‍යතාවලට කිසිදු න්‍යායාත්මක සීමාවක් නොමැති බව පෙනී යාමයි. සැබැවින්ම එබඳු සීමා නිර්ණය කරන්නට පුස්තකාල වෘත්තීය අසමත් වී තිබේ. පරිපාලකයන් වඩාත් නොඉවසිලිමත් කරන්නට මෙය හේතු වේ." [7]

මේ හේතුව නිසා 'මුදල් අග හිඟ කාලවලදී පුස්තකාලය ආවශ්‍යක අංගයකට වඩා සුඛෝපභෝගයක් ලෙස ද, ඇතැම් විට ආහාර සඳහා වෙළෙඳ පළ වටිනාකමට වඩා වියදම් කළයුතු තරබාරු ඌරකු ලෙසද පෙනී යා හැකිය.' [8]

පුස්තකාලයාධිපතිවරු මේ ගැටළුවට විසඳුම් සෙවිය යුතු වන්නාහ. බැලූ බැල්මට පුස්තකාල සේවයෙහි පලදායිතාව ප්‍රමාණ කිරීම දුෂ්කර යයි පෙනී ගියත්, එය මිනීමට ක්‍රමයක් තිබිය යුතුය. කලින් කලට කරනු ලබන පාඨක හෙවත් උපයෝජක සමීක්ෂණ හා වෙනත් සුදුසු ක්‍රම විද්‍යා ඇසුරින් පුස්තකාල පලදායිතාව නිවැරදිව මිනිය හැකි මානයන් සකස් කර ගත යුතු මනාය. ස්වකීය සේවාවෙහි අගය ගැන අනුමිති රහිතව අදාළ බලධාරීන්ට කරුණු ඒත්තු ගැන්විය හැක්කේ එවිට පමණි. ඒ තාක් කල් අපි අපේ දියුණුව අනුන්ගේ අනුකම්පාවට භාර දී සිටින පිරිසක් වෙමු.

පුස්තකාලයාධිපතිවරයා හා ඔහුගේ කාර්ය භාරය පිළිබඳව සමාජයේ වැඩි දෙනෙකුට පැහැදිලි අවබෝධයක් නොමැති වීමද ඔහු/ඇය අවතක්සේරුවකට භාජනය වීමට හේතුවක්ව ඇති බව පෙනේ. 'පුස්තකාලයාධිපති' යන පදය පුහුණු

නුපුහුණු දෙවර්ගයටම අයත් සියලුම පුස්තකාල සේවකයන් හැඳින්වීම පිණිස පොදුවේ භාවිත කිරීම නිසා ඕස්ට්‍රේලියානු පුස්තකාලයාධිකාරීත්වය වෘත්තීය මෙන්ම සාමාජික වශයෙන්ද පීඩාවට පත්ව තිබේ' යැයි මැක්මහෝන් දක්වයි.[9] මේ තත්ත්වය ඕස්ට්‍රේලියාවට මතු නොව ලොව සෙසු රටවලට ද පොදු බව පෙනේ.

වර්තමාන පුස්තකාල සංවිධාන ක්‍රමය අනුව පාඨකයන්ට පුස්තකාලයාධිපතිවරුන් හමුවීමට අවස්ථාවක් නොලැබේ. ඔවුනට හමුවන්නේ පොත් බැහැරදෙන හා විමර්ශන ආදී සේවා අංශවල සේවයේ නියුතු පුස්තකාල සහකරුවන්ය. එහෙයින්ම පොත් නිකුත් කිරීම, පොත් සොයා ගැනීමට උදව් කිරීම, පාඨකයන් ලියාපදිංචි කර ගැනීම හා ඇතැම් විට දඩ මුදල් අය කර ගැනීම ආදී කටයුතු පුස්තකාලයාධිපතීන්ගේ කටයුතු යැයි සිතන්නට ඔවුන් පෙළඹීම සාධාරණය. එවැනි යාන්ත්‍රික කටයුතු සඳහා විශේෂ පුහුණුවක් හෝ ඉහළ වැටුපක් කුමටදැයි ඔවුන් ප්‍රශ්න කිරීමට ඉඩ තිබේ. පුස්තකාලයකදී සාමාන්‍යයෙන් පාඨකයන්ට නොපෙනෙන පැත්තක් තිබේ. පුස්තකාලයේ අරමුණු තීරණය කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, අය වැය හා පාලනය, පොත් තේරීම, ග්‍රන්ථ සංවිධානය (සූචිකරණය, වර්ගීකරණය, අනුක්‍රමණිකාකරණය ආදිය) විමර්ශණ සේවා සංවිධානය ආදී ආයතනික පැවැත්මට අදාළ වන මූලික කටයුතු පුස්තකාලයාධිපතිවරයා අතින් ඉටුවන බවත් ඒ සඳහා ඔහුට විශේෂ වෘත්තීය පුහුණුවක් අවශ්‍ය බවත් පාඨකයෝ නොදනිති. මේ නිසා තමනට නිතරම ඇස ගැසෙන කරුණු ඇසුරින් පුස්තකාලයාධිකාරීත්වය මිනීමට ඔවුහු නැඹුරු වෙති.

අතීතයේදී මෙන්ම අදත් පුස්තකාලයාධිපතිවරයා මානව සම්පර්කයෙන් දුරස්ත වූ ඇතුළු ගැබක සිරවී සිටී. ඔහු එදා මෙන්ම අදත් නිශ්ශබ්දය. ඇතැම්විට විශාල පුස්තකාලයක නම් පුස්තකාලයාධිපතිවරයා නොහඳුනන සේවකයන් පවා සිටීමට ඉඩ ඇත. බොහෝ පුස්තකාලයාධිපතිවරුද වෘත්තීයමය හා වෘත්තීයමය නොවන කටයුතු අතරැති වෙනස වටහා ගන්නට අසමත්ව සිටිති. ස්වකීය විශේෂඥභාවය අවශ්‍ය වන කටයුතුවලට වඩා පුහුණුවක් ලද වෙනත් නිලධාරීන්ට පහසුවෙන් කළ හැකි විගණනය, ගොඩනැගිලි නඩත්තුව, උපකරණ හා ලිපි ද්‍රව්‍ය ආදිය මිලට ගැනීම, කාර්ය මණ්ඩල පාලනය, සේවක වාර්තා පවත්වා ගෙන යාම, කාල සටහන් සම්පාදනය ආදී කටයුතුවල ඔවුහු වැඩි වැඩියෙන් නිරත වෙති. ඇමරිකානු අධ්‍යයන ආයතන පුස්තකාලයාධිපතීන් පිරිසකගේ සමාජ ප්‍රභවය, අධ්‍යාපන කුසලතා, වෘත්තීය පළපුරුද්ද හා පෞද්ගලික චරිත ලක්ෂණ ගැන අධ්‍යයනයක යෙදුණු පෙරී ඩී. මොරිසන් 'වෘත්තීයමය රැකියාවන්ට වඩා ලිපිකරු වෘත්තියේ නිරත වූවන්ගේ ජීවන දෘෂ්ටියට සමාන ජීවන දැක්මක් බොහෝ අධ්‍යයන ආයතන පුස්තකාලයාධිපතීන්ට තිබේ. ඔවුන්ගේ වැඩි දෙනෙකු සැබවින්ම ලිපිකරු මට්ටමේ වැඩවල නිරත වීමට හේතුව මෙය විය හැකියි' පවසයි.[10]

පුස්තකාලයාධිපතිවරුන් ස්වකීය වෘත්තීයමය කාර්යභාරය මැනවින් වටහා ගත යුතුය. පාඨකයන්ට සේවා සැලසෙන්නේ තමනගේ එකී වෘත්තීය කටයුතු නිසා බව ඔවුනට අවබෝධ වන පරිදි පාඨක පුස්තකාලයාධිපති සබඳතා ගොඩනැගෙන සේ වත්මන් පුස්තකාල කටයුතු ව්‍යූහය ප්‍රතිසංවිධානය කළ යුතුය.

පුස්තකාලයාධිපතිවරුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ ප්‍රශ්නද පුස්තකාලයාධිකාරීත්වයේ ප්‍රගමනයට බාධාවක් වී තිබේ. ආරම්භක හා මධ්‍යතන යුගවල විසූ බොහෝ පුස්තකාලයාධිපතිවරු පඬිවරු වූහ. එහෙත් පසුකලක පුස්තකාල සංඛ්‍යාවෙන් වැඩිවත්ම පුස්තකාලයාධිපතීත්වය සාමාන්‍ය අධ්‍යාපනයක් ලද්දවුන් අතට යාම නොවැලැක්විය හැකි කරුණක් විය. කිසියම් වෘත්තියක් සඳහා බඳවා ගැනීමේදී තිබිය යුතු අවම සුදුසුකම් තීරණය කිරීම බොහෝ දුරට ඒ වෘත්තියේ නිරත වූවන්ගේ වෘත්තීයමය සංගම්වල වගකීමකි. වෘත්තීයමය පිළිගැනීම හා ගරුත්වය රැකගැනීමේ හොඳම මාර්ගය වන්නේ එයයි. ලොව බොහෝ වෘත්තීයමය සංගම් වලට දිගු ඉතිහාසයක් ඇතත් පුස්තකාල වෘත්තීයමය සංගම් බිහි වී වසර එකසිය දහතකට වැඩි කලක් ඉක්ම ගොස් නැත. ඇමරිකානු පුස්තකාල සංගමය වර්ෂ 1876දී ද බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමය වර්ෂ 1877දී ද බිහි විය. පුස්තකාල වෘත්තීයමය සංගම් නොමැති රටවල් තවමත් ඇත. වෘත්තීයමය ප්‍රමිතියක් හෝ සම්මතයක් නොමැති කල්හි බලධාරීන්ගේ අභිරුචිය පරිදි ඕනෑම අයෙකු පුස්තකාලයාධිපතිවරයකු ලෙස තෝරා ගැනීමට ඉඩ තිබේ. ප්‍රමිතීන් තිබියදී පවා එසේ සිදුවීමට ඉඩ ඇත. වර්ෂ 1939දී එක්සත් ජනපදයේ කොංග්‍රස් පුස්තකාලයාධිපති වශයෙන් කවියකු පත්කිරීමත්, වර්ෂ 1972දී බ්‍රිතාන්‍ය පුස්තකාලයේ ප්‍රධාන විධායක වශයෙන් සිවිල් සේවකයකු පත් කිරීමත් මෙහිලා සුප්‍රකට නිදසුන් දෙකකි.[11] (කෙසේ වෙතත් මේ සිද්ධි දෙකම පුස්තකාලයාධිපතීන් විසින් පුස්තකාල වෘත්තිය, තම කාර්ය භාරය හා තත්වය ඌන ලෙස හා අසම්පූර්ණ ලෙස අර්ථ නිරූපනය කිරීමෙන් හටගත් ප්‍රතිඵලය).[12]

පෙරී මොරිසන් දක්වන අයුරු 'විශිෂ්ට ගණයේ පුස්තකාලයාධිපතිවරයකු මුල් අවධියේදී ඉතා හොඳ අධ්‍යාපනයක් ලබා තිබිය යුතුවා පමණක් නොව තමාගේ ජීවිත කාලය තුළම ඔහු අධ්‍යාපනය ලැබීමේ කටයුතුවල නිරතව සිටිය යුතුය. එමෙන්ම ඔහු සංස්කෘතික හා කලා කටයුතු සමග හැකි තරම් සම්බන්ධවී සිටිය යුතු වේ'.[13] එසේම ඔහුට හොඳ වෘත්තීය පුහුණුවක් ද අවශ්‍යය. රක්ෂාවක් වශයෙන් පුස්තකාල සේවයට මුල් අවස්ථාවේදීම බැඳීමද පුස්තකාලයාධිපතිත්වයේ සාර්ථකත්වයට හේතුවක් බව මොරිසන්ගේ අදහසයි. සාර්ථක පුස්තකාලයාධිපතිවරයා රචකයකු, ලේඛකයකු විය යුතු බව ද මොරිසන් පවසයි. 'පුස්තකාලයාධිපතිවරයා විසින් පළකර ඇති ප්‍රකාශන සංඛ්‍යාව පැහැදිලිවම වැදගත් වන්නේ ඔහු යම් කිසි ආකාරයක නිවේදකයකු නොහොත් ප්‍රකාශකයකු විය යුතු බැවිනි'.[14]

සමාජයේ කිසිවකුට ප්‍රතික්ෂේප කළ නොහැකි වන අයුරින් කාලීනව පිළිගත් විශිෂ්ට අධ්‍යාපන සුදුසුකම් මත පුස්තකාලයාධිපතිවරුන් බඳවා ගත යුතුය. සුදුසුකම් පදනම මත පිහිටා කටයුතු කළ හොත් දැනට වඩා වෘත්තීයමය පිළිගැනීමක්ද, ඉහළ වැටුපක්ද ලබා ගැනීම පුස්තකාලයාධිපතීන්ට අසීරු දෙයක් නොවනු ඇත.

තමා විසින්ම තම වර්ගයා උග්‍ර ලෙස විවේචනය කරනු ලැබීම අන් කවර

වෘත්තියකටත් වඩා පුස්තකාල වෘත්තියේදී දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. අත්‍යුත්කංසනය, පරවම්භනය, ආත්මපීඩකතාව, පරපීඩකතාව යන මේ කුමක් නිසා හෝ පුස්තකාලයාධිපතීන් විසින් ස්වකීය වෘත්තිය හානිකර විවේචනයට ලක් කරන්නේ නම් එය නිසැකවම වෘත්තීය සංවර්ධනයට හානිකරය. විවේචනය, විශේෂයෙන් ම ස්වයං වෘත්තීය විවේචනය වෘත්තීය සංවර්ධය විෂයයෙහි කිසියම් ප්‍රමාණයකට අවශ්‍යය. එහෙත් එය අහිතකර නොව හිතකර විවේචනයක් වුවමනාය. පුස්තකාලයාධිපතිවරයාගේ පෞරුෂත්වය පිළිබඳ අධ්‍යයනයක යෙදුණු ඩග්ලස් **Library Literature** හි ලැයිස්තු ගත කොට තිබුණු පුස්තකාල වෘත්තිය සම්බන්ධ ලිපි රාශියක් ඇසුරින් එළඹ ඇති නිගමනය නම් පුස්තකාලයාධිපතීන් ස්වකීය වෘත්තිය පිළිබඳව ලියා ඇති ලිපිවලින් වැඩි හරියක් ඒ වෘත්තිය සම්බන්ධ අනෙකුත් විචාරකයන්ගේ ලිපිවලට වඩා මුළුමනින්ම ආත්මපීඩක ස්වභාවයක් හඟවන තරමටම තමන් හා තම සගයන් උග්‍ර විවේචනයට ලක් කරන බවයි.[15]

කෙතරම් වැදගත් හා බලවත් සමාජායතන වුවත් පුස්තකාලය සතු මධ්‍යස්ථ, නිශ්ශබ්ද ස්වභාවය ද පුස්තකාලයාධිකාරිත්වයේ ඉදිරි ගමනට බාධාවක්ව ඇති බව පෙනේ. පුස්තකාලය සතු මෙකී උදාසීන මධ්‍යස්ථභාවය තොරතුරු පද්ධති ගැන අධ්‍යයනයක යෙදෙන මයිකල් බක්ලන්ඩ් මෙසේ මැනවින් පැහැදිලි කරයි. 'පද්ධතිවල පවත්නා තවත් වැදගත් ගුණාංගයක් නම් වෙනස්කම් වලට ප්‍රතිචාර දැක්වීමට, පරිසරයන්ට අනුව ගැලපීමට, පැවැත්ම සඳහා ප්‍රමාණවත් ස්ථාවරභාවයකින් යුතුව සිටීමට ඒවාට ඇති හැකියාවයි. සමහර තොරතුරු පද්ධති, විශේෂයෙන්ම ලේඛනාල හා පුස්තකාල බඳු නොමිලේ තොරතුරු සපයන පද්ධති මීට ප්‍රතිවිරුද්ධ ගති ලක්ෂණ උසුලන බව පෙනේ. ගැලපීම හා ස්ථාවරත්වයට අවශ්‍ය අංග ලක්ෂණ අතින් ඒවා දුලබ බව පෙනී යයි. සිදුවෙමින් පවතින්නේ කුමක්ද යන්න පිළිබඳව ඒවාට ලැබෙන ප්‍රතිපෝෂණය සාමාන්‍යයෙන් දුර්වලය. අසම්පූර්ණය. සමහර විට කොහෙත්ම නැත. ඉලක්ක අපැහැදිලි විය හැකිය. නොසැලකිලිමත් බව නිසා සේවාවන් විවේචනයට ලක්විය හැකිය. පරිසරය කෙරෙහි එතරම් බලපෑමක් කරන්නට ඒවායේ කළමනාකරුවෝ අසමත් වෙති...... ලේඛනාල, පුස්තකාල, වාර්තා මධ්‍යස්ථාන ආදියේ බරපතල ගැටලු පැවතිය හැකි නමුත් ඒවායේ අර්බුද හටගන්නේ ඉතාමත් කලාතුරකිනි. නිශ්ශබ්ද මිනිසුන්ගේ රැකියා සඳහා යෝග්‍ය නිශ්ශබ්ද ස්ථාන ලෙස ඒවා පිළිබඳව තහවුරු වූ ජනමතයක් පවා තිබේ. ඒවා විශාල ස්ථාවර භාවයකින් යුතුව පවතී'.[16]

මන් ද මීට සමාන අදහසක් දක්වා තිබේ. 'පරිපාලකයන් සිය අවධානයෙන් වැඩි කොටසක් වර්ණාවලියේ දෙකෙලවර මිස මැද ඇති ප්‍රශ්න කෙරෙහි යොමු නොකරන බව බොහෝ විට නිරීක්ෂිත කරුණකි. අධ්‍යාපන ලෝකයේදී පුස්තකාලය නිසැකවම මැද පිහිටියකි. එය අර්බුදයකට හෝ කුමන්ත්‍රණයකට හේතු වේ යැයි සිතිය නොහැකිය. එක් අතකින් එය කැරැල්ලක් අවුලුවාලීමට හේතුවක් නොවන අතර අනෙක් අතින් ඩොලර් මිලියනයක වාසියක් ලබා දෙන්නක්ද නොවේ. කෙටියෙන් පැවසුවහොත් පුස්තකාලය යනු අධ්‍යාපන ලෝකයේ නිදා සිටින සුනඛයන්ගෙන් එකෙකි. ලෙල්ලම්ව සිටින පරිපාලකයා ඉතා කැමැත්තෙන් ඌට එසේම සිටින්නට ඉඩ හරී.'[17]

පරිපාලකයන් විසින් පනවනු ලබන නීති රීති, ඇතැම් විට ස්වකීය ආයතනයේ හා වෘත්තියේ අභිවර්ධනයට හානි කර වන කල්හි පවා නිහඬව ඒවා පිළිපදින පුස්තකාලයාධිපතිවරු පෙරළා සටන් නොවදිති. ස්වකීය ප්‍රශ්න සම්බන්ධව පුස්තකාලයාධිපතීන් පරිපාලකයන් සමග උණුසුම් විවාදයන්හි පැටලෙන්නේද ඉතා කලාතුරකිනි. මේ නිසාම පරිපාලකයෝ හෝ බලධාරීහු පුස්තකාල වෘත්තිය සම්බන්ධ ප්‍රශ්නවලට එතරම් ප්‍රමුඛතාවක් ලබා නොදෙති. පුස්තකාල පිළිබඳව ඇල්මැරුණු ආකල්පයක් දරති.

කිසිසේත්ම හිතකර නොවූ මේ තත්ත්වය වෙනස් කරලීම පිණිස පුස්තකාලයාධිපතිවරුන් විසින් පියවර ගතමනාය. පුස්තකාලයේ මධ්‍යස්ථ ස්වභාවය පුස්තකාල වෘත්තියේ නෛසර්ගික දුර්වලතාවක් නොව බුද්ධිමය හා ශාස්ත්‍රීය ගෞරවය නිසා හටගත්තක් බව පරිපාලකයන්ට හා පොදු සමාජයට වටහා දිය යුතුය.

පාදක සටහන්


1. Encyclopaedia of librarianship. Edited by Thomas Landau, 2nd rev. ed., London, Bowes & Bowes, 1961, p. 203
2. එහිම, පි. 198
3. තොම්සන්, ජේම්ස්. පුස්තකාල බලයඃ පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ නව දර්ශනයක්, කොළඹ: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1986, පි. 5-6
4. Encyclopaedia of librarianship. 1961, p. 198
5. Mc Mahon, Anne. The personality of the librarian: prevalent social values and attitudes towards the profession, Adelaide, Libraries Board of South Australia, 1967, p. iii
6. එහිම, පි. 23
7. Munn, Robert F. The bottomless pit, or, The academic library as viewed from the academic building, pp. 51-54. **In** col-lege and research libraries, Jan. 1968
8. Hunt, Christopher J. The relationship between the academic library and the parent institution, p. 12, **In** Academic library management, edited by Maurice B. Line, London, Library Association, 1990
9. Mc Mahon, Anne .........., p. 26
10. එහිම, පි. 15
11. තොම්සන්, ජේම්ස්, ........., පි. 8
12. එහිම, පි. 10
13. එහිම, පි. 17
14. එහිම, පි. 21
15. Mc Mahon, Anne......., p. 15
16. Buckland, Michael, Information and In-formation systems, New York, Paragen, 1991, p. 28
17. Munn, Robert F..... , p. 52

# USER EDUCATION IN ACADEMIC LIBRARIES

**I. Mudannayake,**
**Assistant Librarian,**
**Postgraduate Institute of Agriculture,**
**University of Peradeniya**

"User education" refers to all methods of teaching users how to use a library. This is a service which is very essential in order to get the maximum utilization of library resources and services. When it comes to academic libraries user education programmes need to play an active role in developing information skills of the academic community. Although librarians are aware of the importance of user education programmes, especially in developing countries less priority is given for this activity when compared to other library services. Keith G.E. Harris (1982), an information scientist, has pointed out that the information services available in libraries are seriously underused, and the majority of existing scientific and technical information services are used by a small proportion of potential users. He has also given the reasons for this as follows.

a) **the increase in complexity and the volume of information.**

b) **the unawareness of available information by scientists and academics those who did not have training of information skills during their student careers in the university.**

A recent periodical survey (1983) carried out at the agriculture library of the University of Peradeniya also proved that about 55% of the periodicals acquired by the library are underused. Therefore it is vital that the academic libraries should develop effective user education programmes for the maximum utilization of their library resources. It will help the society to learn that librarians play an important role in the dissemination of information and also on the other hand the librarians have the responsibility of making the library resources more and more utilized by the users.

**The University education tends to motivate students how to learn rather than just making them learn. The development of different teaching methodologies used for university education at present have made an impact on students to use libraries more effectively. Some of the new methods such as project work, seminars and discussions, group work etc. make the students turn to libraries more and more.**

The University education tends to motivate students how to learn rather than just making them learn. The development of different teaching methodologies used for university education at present have made an impact on students to use libraries more effectively. Some of the new methods such as project work, seminars and discussions, group work etc. make the students turn to libraries more and more.

## Planning of User Education Programmes

The user education programmes conducted in academic libraries have to be carefully planned and so well directed that a large proportion of students and staff members could get the maximum assistance from the library. The failures of user education programmes mainly depend on the facts that the programmes were not well designed and the incapabilities of the librarian who administered the programme as an instructor. Therefore when designing user education programmes the librarian or the officer who is responsible for this activity has to get the assistance from the academic staff members in order to get information about the group of students to whom the programme is aimed at, to know about their subject specialties and the purpose of their information seeking etc. **Fjallbrant** (1976), has studied about user education programmes conducted at Chalners University of Technology in Sweden has pointed out some goals and objectives of user education programmes which can be taken as a base for planning user education programmes. The programmes should be;

1) **to enable the users to understand the pattern of communication and the channels for information flow in order to become aware of different ways in which information can be obtained.**

2) **to enable the users to become aware of the information resources available for them at their own and other libraries.**

3) **to enable the users to learn how to use various tools available for information searching, on their subject interests in the university and also for their in tended work in future.**

**4) to create a positive attitude to information searching which will stimulate the user to make use of resources available in other libraries.**

Therefore a clear set of objectives is essential in planning user education programmes. In addition to that there are some important facts that should take into consideration by librarians when planning user education programmes.

**1) The librarian has to keep in mind the user community in terms of groups. It is essential that the librarian has to divide the academic user community into groups such as freshmen or freshers (newcomers to the university), senior students, graduate students, professional students and the members of academic (faculty) staff. Different programmes have to be designed for these groups. Library orientation programmes should be given to freshmen and high level library instruction is needed for graduate students and academic staff members.**

**2) Timing of User Education Programmes. It is very important to provide right library instructions at a point when a student is motivated towards learning of a specific subject and he looks for materials on that subject field. It is well observed that the library orientation programmes conducted at the beginning of each academic year for freshers at the agriculture library of the University of Peradeniya are not successful as the students are not settle down with their studies and they are not prepared to use the library at that time. User education programmes conducted for final year Agriculture students before they start working on their research projects seem to be successful as they are motivated for seeking information at that time.**

**3) Teaching methods.**

**Teaching methods have to be carefully designed to achieve best results. User education programmes need not to be conventional lecture type, but it should be more practical and provide an environment for small group participation on a given project.**

**Designing of User Education Programmes**

When designing a programme for user education, the librarian needs to have a clear idea about the targeted group to whom the programme is being administered. **Wiggins** (1974), has shown some principles which have been observed by the Young University in Birmingham, USA, in developing user education programmes which also can be used as a base.

**1) All instructions should be designed to meet the immediate needs of students in different levels, eg. freshers, senior students, graduate students etc.**

**2) No attempt should be made to teach everything to a student ever need to know throughout his entire university career. It is meant that basic information about the library resources and services should be given for lower level students and advanced trainings are needed for senior students and graduate students.**

**3) All programmes as much as possible should be provided at the library building itself for practical reasons.**

**4) At the end of each programme assignments have to be done and the students should be graded in order to encourage them for active participation.**

user education programmes are being regularly conducted as library orientation programmes for freshers as soon as they get admitted to the university. Guided tours supplemented with library hand books are the main methods used for these programmes in many academic libraries. The observations made at the Agriculture Library of the University of Peradeniya proved that the present orientation programmes are not very fruitful.

The reasons for success of user education programmes conducted in academic libraries in developed countries depends on the fact that these programmes are offered as regular course units along with other study programmes. The students are also being assessed in terms of assignments, practical work etc. In academic libraries in Sri Lanka user education programmes are being regularly conducted as library orientation programmes for freshers as soon as they get admitted to the university. Guided tours supplemented with library hand books are the main methods used for these programmes in many academic libraries. The observations made at the Agriculture Library of the University of Peradeniya proved that the present orientation programmes are not very fruitful. Therefore it is important that the user education programmes to be included for the academic programmes and the students should be assessed in order to get the

best results of conducting these programmes. These programmes can be combined with regular English language courses too.

### The Methods Used for User Education Programmes

A wide range of methods are being used for conducting user education programmes. Some of these methods are lectures, seminars and demonstrations, guided tours, book/printed guides, programmed instruction and individual instructions.

### The Lecture Method

The lecture method is the conventional way of giving user education which is generally administered for a larger group of students. Audio-visual materials have to be used with this method of instruction. Lecture method will not only make students aware of different tools used for information seeking, but it also should include guidance for writing citations correctly etc. Lectures given for freshers at the beginning of their students career proved to be a waste of time. Therefore lecture methods has to be applied for students at the right time when they are motivated towards projects etc.

### Seminars and Demonstrations

These methods can be administered for a smaller group which will create an environment that the students can freely ask questions about the materials being presented. Audio - visuals can be used for this method too.

### The Guided Tour

The traditional way of library orientation is the **guided tour (herded tour)** in which the students are given a short tour around the library especially for freshers during their first week of the university. Most of the guided tours have proved to be a waste of time as it takes a considerable part of time of the instructor. **Academic libraries in western countries have prepared audio-cassette tapes to be used with guided tours for overcoming this problem**. The tour is organized for individuals or groups which they can do the tour with the walking cassette. The audio-cassettes will guide the tour and the users have to follow the instructions given by the cassette. This method found to be fruitful since it saves the time of the instructor.

### The Book/Printed Guides

**Printed information in the forms of books, compendias or guides** are used in this method of instruction. The advantage of this method is that these printed materials can be obtained whenever a student is needed library instruction. These guides should be carefully prepared taking into consideration the different levels of students in a university, and they can be supplied in different times. A simple basic guide can be provided for freshers during their **library orientation programmes** at the beginning. The students can study this guide with their own speed of grasping facts. Printed guides giving information about different information tools can be provided for senior students on different subjects when they work on their projects etc.

### Programmed Instruction

This method can be carried out by using a variety of media, such as books, slides, or by means of computer aided instruction (CAI). The users are supposed to study about a bibliographic tool by using the above media and they have to assess their knowledge by answering the questions given in the media itself. This method is also useful for individual user instructions. This method helps students to study the contents of the package well, in order to answer the questions.

### Individual Instructions

Individual instructions can be carried out at the reference desk when a student is looking for some information.

Taking into consideration these facts and views, User Education Programmes can be developed in academic libraries in order to improve the information skills of the academic community and on the other hand for maximum utilization of library resources.

#### References


1. Fjallbrant, Nancy. "Teaching methods for the education of the library user". **Libri: International Library Review** 26 (Dec. 1976): 252-267.

2. Harris, Keith G.E. "user education" **Libri: International Library Review** 32 (Dec. 1982) : 327-335.

3. Wiggins, Marvin E. "The development of library use instructional programmes". **College and Research Libraries** 33 (Nov. 1972): 473-479.

# இலங்கையில் சர்வதேச தராதர பருவ வெளியீட்டு இலக்கத் திட்ட அமுலாக்கம்


அமரா நாணாயக்கார,
உதவி நூலகர்,
இலங்கைத் தேசிய நூலகம்.


**பின்னணி**

இலங்கைப் பாராளுமன்றத்தின் 1970ஆம் ஆண்டின் 17ஆம் இலக்கச் சட்டத்தின் கீழ் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை உருவாக்கப் பட்டது. இந்த சபையின் முக்கிய நோக்கமானது, நீடிய காலமாக நாட்டின் முக்கிய குறையாக உணரப் பட்ட இலங்கைத் தேசிய நூலகத்தை ஸ்தாபிப்பதாக அமைந்தது. இக்குறை யானது 1990ஆம் ஆண்டு, ஏப்ரல் மாதம், 27 ஆம் திகதி இலங்கைத் தேசிய நூலகம் அங்குரார்ப்பணம் செய்யப்பட்ட போது நிவர்த்தியானது.

1885ஆம் ஆண்டின் அச்சீட்டாளர், வெளியீட்டாளர் சட்டத்தின்படியும், இதன் 1976ஆம் ஆண்டுத் திருத்தச் சட்டத்தின் படியும் இலங்கைத் தேசிய நூலகமானது, பருவ வெளியீடுகள் உட்பட, இலங்கையில் வெளியிடப் படும் சகல பிரசுரங்களிலும் ஒரு பிரதியைப் பெற்றுக்கொள்வதன் மூலம் ஒரு சட்ட வைப்புச் சேர்க்கையைப் பேணுகிறது.

இலங்கைத் தேசிய நூலகத்தினால் தொகுக்கப்பட்டு வெளியிடப்படும் இலங்கைத் தேசிய நூற்பட்டியலானது, பருவ வெளியீடுகளுக்கான நூற் பட்டியற் தகவலைக் கட்டுப்படுத்தும் ஒரு மார்க்கமாகும். எனினும் இலங்கைத் தேசிய நூலகமானது சர்வதேச தராதர பருவ வெளியீட்டு எண்ணின் முக்கியத்துவத்தை உணர்ந்து இந்த ISSN திட்டத்தை இலங்கையில் செயற்படுத்த முடிவு செய்தது.

**ISSN தேசிய நிலையத்தின் ஸ்தாபிதம்**

ISSN திட்டத்தை இலங்கையில் செயற்படுத்துமுகமாக **1984ஆம் ஆண்டில், இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையானது**, ISSN **தேசிய நிறுவனமாக ஏற்றுக் கொள்ளப்பட்டது.**

இதையடுத்து இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை, கல்வி யமைச்சின் அங்கீகாரத்துக்கு விண்ணப் பித்தது. பரிஸ் நகரிலிருக்கும் ISSN நிலையத்தின் நெறியாளருடன் 1987ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 22ஆம் திகதி, இலங்கைத் தேசிய நூலக சேவைகள் சபைத் தலைவரும் நெறி யாளரும் ஒரு கலந்துரையாடலில் பங்குபற்றினர். இக்கலந்துரை யாடலின் விளைவாக கீழ் வரும் நட வடிக்கைகள் சபையினால் எடுக்கப் பட்டு, அதன் அறிக்கை பரிஸ் நகரிலிருக்கும் தலைமையகத்துக்கு அனுப்பப்பட வேண்டும் என்று முடிவு செய்யப்பட்டது.

அ) சர்வதேச நிலையத்தின் தரா தரத்தை அங்கீகரித்து, இலங்கைக் குரிய ISDS தேசிய நிலையத் துக்காக ஒரு தேசிய நிலையத்தை நியமிப்பதாக உறுதி செய்வதன் மூலம் இலங்கையானது ISDS நிலையத்துடன் இணைந்து கொள்ள நடவடிக்கை எடுத்தல்.

ஆ) இலங்கைத் தேசிய நூலக நெறியாளருக்கும், பரிசில் இருக்கும் ISDS சர்வதேச நிலையத்தின் நெறியாளருக்கும் இடையிலான இருதலைப்பட்ச உடன்படிக்கை யில் கைச்சாத்திடல்.

எவ்வாறாயினும், 1992ஆம் ஆண்டு வரை எதுவித முன்னேற்றமும் ஏற்பட வில்லை. ஆகையினால் இவ்விடயம் மீண்டும் கவனத்திற்கெடுக்கப்பட்டது. பரிசில் இருக்கும் ISDS சர்வதேச நிலையத்துடனான தகவல் தொடர் பின்மை, உத்தியோகத்தர் பற்றாக் குறை, தகுந்த பயிற்சித் தேவை போன்ற இன்னோரன்ன காரணங் களினால் இத்திட்டமானது 1993ஆம் ஆண்டு வரை செவ்வையாகச் செயற் பட முடியவில்லை.

**1984ஆம் ஆண்டிலிருந்து பின்வரும் நடவடிக்கைகள் எடுக்கப்பட்டன.**

1. இலங்கையில் ISSN திட்டத்தை அறிமுகப்படுத்துவதற்கும் ISSN நிலையத்தை உருவாக்குவதற்கும் ISO 3297ஐ உபயோகிப்பது உகந்ததா போன்ற விடயங்களில் சபைக்கு உபதேசிப்பதற்கு ஒரு ஐந்து அங்கத்தவர் கொண்ட தேசியக் குழு சபையினால் நியமிக்கப்பட்டது. இக்குழு வானது இலங்கையில் ISO 3297 கட்டளையானது போதுமானதா என்பதைப் பரிசோதித்துத் தனது திருப்தியைத் தெரிவித்தது.

2. 1992ஆம் ஆண்டின் கடைசிக் காலாண்டுப் பகுதியில் இலங்கையில் வெளியிடப்படும் பருவ வெளியீடுகளுக்கான ஒரு புள்ளி விபர மதிப்பீடு நடாத்தப்பட்டது. அந்த மதிப்பீடானது 1972ஆம் ஆண்டு தொடக்கம் 1992ஆம் ஆண்டு வரையான இருபது ஆண்டு காலப் பகுதியை உள்ளடக்கியது. இதன்படி இக்காலப் பகுதியில் வெளியிடப்பட்ட பருவ வெளியீடுகள் அண்ணளவாக 4360 ஆகும்.

தற்போது இலங்கையில் சிங்களம், தமிழ், ஆங்கிலம் ஆகிய மும் மொழிகளிலும் ஆண்டொன்றுக்கு, புதினப் பத்திரிகைகள் தவிர, அண்ணளவாக 250 பருவ இதழ்கள் வெளியிடப்படுகின்றன.

3. பரிஸ் நகரிலிருக்கும் சர்வதேச நிலையத்தின் நெறியாளருக்கும், இலங்கைத் தேசிய நூலக நெறியாளருக்கும் இடையிலான இருதலைப்பட்ச உடன்படிக்கை கைச்சாத்திடப்பட்டது.

4. பரிசிலிருக்கும் சர்வதேச ISSN நிலையத்திலிருந்து ஒரு தொகுதி ISSN இலக்கங்கள் பெற்றுக் கொள்ளப்பட்டது. இலங்கையில் பாவனைக்காக ஒதுக்கப்பட்ட ISSN தொகுதி பின்வமாறு; 1391 000 999

5. இலங்கையில் வெளியிடப்படும் பருவ வெளியீடுகளுக்கான ISSN இலக்கங்களை ஒதுக்குவது 1993ஆம் ஆண்டு ஒகஸ்ட் மாதம் 1ஆம் திகதியிலிருந்து ஆரம்பமானது. இன்று வரையும் ஆறு பருவ இதழ்களுக்கு மட்டுமே ISSN இலக்கங்கள் வழங்கப்பட்டுள்ளது. வெளியீட்டாளர்களிடமிருந்து கிடைக்கப் பெறும் வேண்டுகோளைத் தொடர்ந்து இன்றும் ISSN தொடர்ந்து வழங்கப்பட்டு வருகிறது.

இலங்கையில் ISSN நிலையம் ஸ்தாபிக்கப்படுவதற்கு முன்னதாக இலங்கையில் வெளியிடப்பட்ட பருவ இதழ்களுக்குரிய ISSN ஆனது பரிஸ் நகரிலிருக்கும் ISSN சர்வதேச நிலையத்தினால் வழங்கப்பட்டது.

பருவ இதழ்கள் வெளியீட்டாளரிடையே இந்த ISSN திட்டத்தைப் பிரபலப்படுத்துவதற்காகவும், அவர்களுக்கு இதனைப் பற்றிய போதிய விளக்கத்தை அளிப்பதற்காகவும், இந்தப் பருவ இதழ் வெளியீட்டாளருக்கான ஒரு கருத்தரங்கை ISSN தேசிய நிலையமானது நடாத்த உத்தேசித்துள்ளது. புதினப் பத்திரிகைகளில் விளம்பரப்படுத்துவதன் மூலமும் ISSN திட்டம் பற்றிய மேலதிக பிரபலத்தை உண்டு பண்ணத் தேசிய நிலையம் உத்தேசித்துள்ளது.

### ISSN திட்டத்தின் அனுகூலங்கள்

1. **இலங்கையில் வெளியிடப்படும் பருவ இதழ்களைத் தேசிய, பிறநாட்டு வாசகர்களுக்குப் பிரபலப்படுத்தி, விளம்பரப்படுத்துகிறது.**

2. **தேசிய மட்டத்திலும் சர்வதேச மட்டத்திலும் இலங்கைப் பருவ இதழ்களின் விற்பனையைக் கூட்டுகிறது.**

3. **இலங்கையில் வெளியிடப்படும் பருவ இதழ்களை அடைவதை இலகுவாக்குகிறது.**

4. **தேசிய நூற்பட்டியல்களிலும், நூல் வெளியீட்டாளரின் பட்டியல்களிலும், நூலகங்களினால் தயாரிக்கப்படும் பட்டியல் அட்டைகளிலும் காணப்படும் பருவ இதழ்களின் பட்டியல் விபரங்களில் இதுவும் ஒரு அம்சமாக உள்ளது.**

5. **தரவுத் தளங்களை அடைய இலகு வாகின்றது.**

### பிரதிகூலங்கள்

1. **ISSN அறிமுகப்படுத்தல், பராமரித்தல் செயன்முறைகள், ISBN திட்டச் செயன்முறைகளிலிருந்தும் பெரிதும் வேறுபட்டவை.**

2. **பயிற்றுவிக்கப்பட்ட ஊழியர் பற்றாக் குறை**

இலங்கையில் வெளியிடப்படும் பருவ இதழ்களுக்கு ISSN வழங்குதல், வெளியீட்டாளர் மத்தியிலும் தகவல் துறை சமுதாயத்தின் மத்தியிலும் ISSN பாவனையை அதிகரித்தல் என்பன நூலக, வெளியீட்டுத் துறைகளில் ஏற்படும் ஒரு பாரிய முன்னேற்றப்படியாகும்.

### உசாத்துணைகள் ;


ISSN System in Sri Lanka.
ISDS Manual


இவ்வறிக்கையானது, தாய்லாந்து தேசிய நூலகத்தில் 1993.09.15 1993.09.17 வரை நடைபெற்ற "ஆசிய நாடுகளுக்கான கருத்தரங்கில்" இலங்கைத் தேசிய நூலகத்தைச் சேர்ந்த உதவி நூலகர் திருமதி. அமரா நாணயக்காரவினால் சமர்ப்பிக்கப்பட்ட ஆங்கில மூலத்தின் மொழிபெயர்ப்பாகும்.

மொழிபெயர்த்தவர் ; திருமதி. துஷ்யந்தி டானியல்.

# බොලොඤ්ඤා පොත් ප්‍රදර්ශනය 1993


**නිලමණී අබේරත්න**

ලේකම්

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය


"පොත් ප්‍රදර්ශනය" නැතහොත් "පොත් සල්පිල" යන වචනයත් ඉන් අදහස් වන ක්‍රියාදාමයත් සාමාන්‍යයෙන් කවුරුත් පාහේ දන්නා දෙයකි. පොත් ප්‍රදර්ශනයක් යම් ස්ථානයක පැවැත්වෙන බව ඇසූ පමණින්ම අපට හැඟෙන්නේ එහි, පොත්, ප්‍රදර්ශනය වන අතරම එම පොත් එම ස්ථානයෙන් මිලයට ගත හැකි බවය. එවැනි ප්‍රදර්ශන මගින් අරමුණු කිහිපයක්ම ඉටු වේ. ප්‍රදර්ශනය වන පොත් පත්වල වැඩි අලෙවිය, එම ප්‍රකාශන සඳහා ප්‍රචාරය හා ප්‍රසිද්ධිය ලැබීම, බොහෝ විට ප්‍රදර්ශනය වන ප්‍රකාශන වට්ටම් සහිතව මිලයට ගැනීමට ඇති හැකියාව, පොත් ඇණවුම් කිරීම ඉන් කිහිපයකි. අවසාන වශයෙන් සමාජයේ එම පොත් අවශ්‍ය කොටසට එම පොත් ලැබීමත්, පොත පත සුලබ වීමත් කියවීමේ රුචිය වර්ධනය වීමත් මේ තුළින් ඉටුවන වැදගත් අරමුණු වේ. සමහර අවස්ථාවල දී මෙවැනි ප්‍රදර්ශනයක් පැවැත්වෙන අතරතුර එම කාල සීමාව තුළම ග්‍රන්ථකරණය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයනට අදාළව සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදිය පැවැත්වීම ද දැකිය හැකිය. අප දන්නා පරිදි මෙවැනි ප්‍රදර්ශනත්, සම්මන්ත්‍රණ හා වැඩමුළුත්, පොත් පත් හා සම්බන්ධ පෞද්ගලික අංශයේ විවිධ ආයතන මගින් මෙන්ම රාජ්‍ය මට්ටමින් ද සංවිධානය කරනු ලැබේ.

විදේශීය රටවල ද සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පොත් ප්‍රදර්ශනයක් පැවැත්වූයේ 1991 වර්ෂයේදීය. එම වර්ෂයේ අප රටේ පැවැති සාර්ක් සමුළුව නිමිත්තෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් එම ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. සාර්ක් රටවල පොත් ක්ෂේත්‍රයට සම්බන්ධ සංවිධාන ගණනාවක් එම ප්‍රදර්ශනයට සහභාගි විය. 1991 නොවැම්බර් 01 දින සිට නොවැම්බර් 10 දින දක්වා පැවති මෙම ප්‍රදර්ශනයේ දී ඉහත සඳහන් කළ පරිදි පොත් ක්ෂේත්‍රයට අදාළ ව සම්මන්ත්‍රණ මාලාවක් ද පවත්වන ලදී. විශේෂ වට්ටම් සහිතව සෑම ක්ෂේත්‍රයකටම අදාළ පොත් පාඨක ජනතාවට මෙහිදී මිලයට ගැනීමට හැකි විය.


ප්‍රදර්ශන භූමිය වශයෙන් පාවිච්චි කරන භූමි භාගය විවිධ ප්‍රදර්ශන හා සල්පිල් සඳහා තනවන ලද ස්ථිර ප්‍රදර්ශන භූමියකි. ප්‍රදේශවාසී ජනතාවට පමණක් නොව ලොව නන් දෙසින් පැමිණෙන කවර හෝ විදේශිකයෙකුට මෙම ස්ථානයට ළඟා වීම පහසුය.


ජාත්‍යන්තර වශයෙන් වැදගත් පොත් ප්‍රදර්ශන සෑම එකකම පොත් අලෙවිය ඉතා ඉහළ මට්ටමක පවතින අතර යහපත් පාඨක ප්‍රතිචාරයක් පවතී. ජාත්‍යන්තර වශයෙන් තම ප්‍රකාශන සඳහා ප්‍රසිද්ධියක් ලබා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ ආයතන හා පුද්ගලයන් සමඟ සම්බන්ධතාවක් ගොඩනඟා ගැනීම, පොත් මුද්‍රණය, පොත් සැලසුම් කිරීම, තාක්ෂණය, ප්‍රචාරණ විධි, ප්‍රදර්ශනය (Display) වැනි ක්ෂේත්‍රයට අදාළ සෑම අංශයකින් ම තම දැනුම දියුණු කර ගැනීමට මෙම ප්‍රදර්ශන ඉවහල් වේ. වර්ෂ දෙකකට වරක් පැවැත්වෙන නවදිල්ලි ලෝක පොත් ප්‍රදර්ශනය, ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ කොට්ටායම් වාර්ෂික පොත් ප්‍රදර්ශනය, ජපානයේ වාර්ෂික පොත් ප්‍රදර්ශනය, ෆ්‍රැන්ක්ෆර්ට් පොත් ප්‍රදර්ශනය, මෑත කාලයේ සිට මැද පෙරදිග පැවැත්වෙන විවිධ පොත් ප්‍රදර්ශන මෙවැනි ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන අතරින් කිහිපයකි.

පොත් ප්‍රදර්ශන පිළිබඳ ව පොදුවේ මෙම කරුණු සඳහන් කරන ලද්දේ බොලොඤ්ඤා පොත් ප්‍රදර්ශනයට පසුබිමක් වශයෙනි.

1993 අප්‍රේල් 15 දින සිට 18 වන දින දක්වා ඉතාලියේ බොලොඤ්ඤා නගරයේ දී 30 වන බොලොඤ්ඤා ජාත්‍යන්තර ළමා පොත් ප්‍රදර්ශනය පැවැත්විණි. මෙම ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන් වශයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිනි ඊශ්වරී කොරයා මහත්මියට ද, මට ද, සහභාගී වීමේ අවස්ථාව ලැබුණි.

1964 දී පළමුවරට පවත්වන ලද මෙම ප්‍රදර්ශනය මෙම වසරේ දී පවත්වන ලද්දේ තිස්වන වතාවට ය. එය වාර්ෂිකව පැවැත්වෙන්නකි. බොලොඤ්ඤා, අපරදිග පැරණිම විශ්වවිද්‍යාලයයක් සතු වීමේ ගෞරවය හිමිකර ගන්නා නගරයකි. ඒ අනුව මෙම ප්‍රදර්ශනය පැවැත්වෙන්නේ අධ්‍යාපනික වශයෙන් ඉතාලියේ මෙන්ම අපරදිගත් වැදගත් ස්ථානයක් හිමි වූන නගරයක වේ. රාජ්‍ය නොවන සංවිධානයක් මගින් සංවිධානය කරන මෙම ප්‍රදර්ශනය සාමාන්‍යයෙන් සෑම වර්ෂයකම අප්‍රේල් මාසයේ දී පවත්වනු ලැබේ.

ප්‍රදර්ශන භූමිය වශයෙන් පාවිච්චි කරන භූමි භාගය විවිධ ප්‍රදර්ශන හා සල්පිල් සඳහා තනවන ලද ස්ථිර ප්‍රදර්ශන භූමියකි. ප්‍රදේශවාසී ජනතාවට පමණක් නොව ලොව නන් දෙසින් පැමිණෙන කවර හෝ විදේශිකයෙකුට මෙම ස්ථානයට ළඟා වීම පහසුය. ඉතාලියේ ප්‍රවාහනය සම්බන්ධව සලකා බැලීමේදී බස්, ට්‍රෑම් රථ, දුම්රිය හා ප්‍රාදේශීය ගුවන් සේවාව ද වැදගත් තැනක් ගනී. බොලොඤ්ඤා හි ප්‍රධාන බස් නැවතුම, දුම්රියපොළ මෙන්ම බොලොඤ්ඤා ගුවන් තොටුපළ සිට ගමනාරම්භ කරන බස් රථ බොලොඤ්ඤා සල්පිල හරහා ධාවනය වේ. ප්‍රදර්ශන භූමිය අවට විදේශිකයන් සඳහා නවාතැන් පහසුකම් සුලබ අතර, ප්‍රදර්ශන භූමිය තුළ ද ආපනශාලා, බැංකු පහසුකම් වැනි වෙනත් පහසුකම් ද ඇත.

ප්‍රදර්ශන භූමිය සෘජුකෝණාස්‍රාකාර විශාල ගොඩනැගිලි රාශියකින් යුක්තය. මින් එක ගොඩනැගිල්ලක් පරිපාලන සංකීර්ණය වශයෙන් භාවිත වේ. 1993 පොත් ප්‍රදර්ශනය සඳහා රටවල් 59 කින්

ප්‍රදර්ශකයන් 1360 ක් පමණ සහභාගි විය. මින් වැඩිම ප්‍රදර්ශකයන් සංඛ්‍යාව සහභාගි වූයේ ඉතාලියෙනි. ඉතාලියට කුටි 116 ක්ද මහා බ්‍රිතාන්‍යයට කුටි 84 ක්ද වෙන් කර තිබුණි. ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය මීළඟ ට වැඩිම ප්‍රදර්ශකයන් සංඛ්‍යාව සහභාගි වූ රටවල් ය.

රාජ්‍ය මට්ටමින් සහභාගි වූ සංවර්ධනය වෙමින් පවතින රටවල් කිහිපයක් සඳහා නොමිලයේ එක් කුටිය බැගින් වෙන්කර තිබුණි. අප්‍රිකානු රටවල් කිහිපයක් සඳහාත්, ආසියාතික රටවල් අතරින් ඉන්දියාව හා ශ්‍රී ලංකාවටද මෙම අනුග්‍රහය ලැබිණි. මෙම රටවලින් ද වාණිජ මට්ටමෙන් සහභාගි වූ පෞද්ගලික ආයතන සඳහා එම අනුග්‍රහය නොලැබුණි.

බොලොඤ්ඤා ළමා පොත් ප්‍රදර්ශනය තුළ දී එහි ප්‍රදර්ශනය වන පොත් පත් අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. ප්‍රදර්ශනයෙහි වැදගත්ම අරමුණු වන්නේ, ලොව ළමා පොත් නිෂ්පාදනයට දායක වන සියළුම කොටස් එකට මුණගැසීමත්, පොත් කර්මාන්තයේ වර්ධනයට එම කොටස්වල දායකත්වය ඉස්මතු කරවීමත්, එමගින් එම කොටස්වල හැකියාවන් අනෙක් රටවල් සමඟ හුවමාරු කර ගැනීමත්, තමන්ගේ ප්‍රකාශන සඳහා හොඳ වෙළඳපළක් ලබා ගැනීමත් ය. ළමා පොත්වලට අමතර ව ප්‍රාථමික අධ්‍යාපනයේ දී වැදගත් වන අධ්‍යාපනික ක්‍රියාකාරකම්වලට අවශ්‍ය උපකරණ, ඉගැන්වීමේ උපකරණ හා පාසල් උපකරණ ද මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි. චීන ළමා පොත් චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර ප්‍රදර්ශනයක් ද එක් කොටසක පැවැත්විණි. මියුනික් හි ජාත්‍යන්තර යොවුන් පුස්තකාලය (IYL) ජාත්‍යන්තර ළමා හා යොවුන් ග්‍රන්ථ මණ්ඩලය (IBBY) වැනි ළමා හා යොවුන් පතපොත වර්ධනයෙහි ලා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන කිහිපයක්ම වාර්ෂිකව මෙම ප්‍රදර්ශනයට සහභාගි වේ. ප්‍රදර්ශනයට සම්බන්ධව වෙනත් වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය මෙහි පැවැත්වෙන්නේ නැත.

යුරෝපය ඇතුළු රටවල් ගණනාවක ළමා පොත් කතුවරුන්, චිත්‍ර ශිල්පීන්, ප්‍රකාශකයන්, එම කොටස් නියෝජනය කරන ආයතනයන්හි නියෝජිතයන් විශාල සංඛ්‍යාවක් ආරාධිත පිරිස අතර විය. සාමාන්‍ය ජනතාව ප්‍රදර්ශනය නැරඹීම සඳහා එතරම් උනන්දු කරවීමක් දක්නට නොලැබුණි. සමහර වර්ෂයන්හි දී ප්‍රදර්ශනය අවසන් දින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ප්‍රදර්ශනය නැරඹීමට අවස්ථාව උදා කර දෙන බැව් දැනගන්නට ලැබිණි. නමුත් මෙම වසරේ එවැනි අවස්ථාවක් නොතිබිණි.

> අප රටේ දක්ෂ ළමා පොත් කතුවරුන්, දක්ෂ ළමා පොත් චිත්‍ර ශිල්පීන් සිටිති. එහෙත් අපගේ ළමා පොත් ජාත්‍යන්තර ළමා පොත් හා සසඳන කළ පෙනෙන දුර්වලතා කිහිපයකි. මුද්‍රණ කඩදාසිවල තත්ත්වය, චිත්‍ර කළු සුදු රේඛා චිත්‍ර වීම, ළමා මනසට යෝග්‍ය චිත්‍ර අඩු වීම ආදිය ඉන් කීපයකි.

වසරේ හොඳම පොත් වශයෙන් තෝරා තිබූ පොත් වෙනම ප්‍රදර්ශනාගාරයක ප්‍රදර්ශනය සඳහා තබා තිබුණි. අන්තර්ජාතික කමිටුවක් මගින් ප්‍රාථමික වයසේ දරුවන් සඳහා ප්‍රකාශිත හොඳම පොත හා විශේෂ සම්මානලාභී පොත් තෝරා තිබිණි. වයස අවුරුදු හය සහ නවය අතර වූ දරුවන් නව දෙනෙකුගෙන් සමන්විත කමිටුවකින් ද එක් පොතක් ත්‍යාග පිරිනැමීමට තෝරා තිබිණි.

ප්‍රදර්ශනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම් වස් ප්‍රදර්ශකවරු විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබිණි. වාණිජ මට්ටමින් සහභාගි වූ සෑම ප්‍රදර්ශකයෙක්ම වෙළෙඳ පළට තමා ඉදිරිපත් කරන ප්‍රකාශනය සම්බන්ධව සිත් ගන්නා සුළු අන්දමේ පත්‍රිකා, පෝස්ටර්, නාමාවලි ආදිය මගින් විශාල ප්‍රචාරයක් ලබා දී තිබුණි. ප්‍රදර්ශනය ඇරඹීමට මාස කිහිපයකට පෙර සිට ඔවුන් මෙම ප්‍රචාරක වැඩ පිළිවෙළවල් අරඹා තිබිණි.

බොලොඤ්ඤා ළමා පොත් ප්‍රදර්ශනයට සහභාගිවීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන රාශියකි.

- ✳ තම රටෙහි ළමා පොත් ප්‍රචාරය කිරීම.
- ✳ තම රටෙහි ළමා පොත් වෙනත් රටවල භාෂාවනට පරිවර්තනය කිරීම.
- ✳ තම රටෙහි ළමා පොත් චිත්‍ර ශිල්පීන් හා ලේඛකයන් අන් රටවලට හඳුන්වා දීම.
- ✳ තම රටෙහි සංස්කෘතිකමය වටිනාකම් තවත් රටකට හඳුන්වා දීම.
- ✳ පොත් කර්මාන්තයෙහි නව තාක්ෂණ ක්‍රම ප්‍රචාරය කිරීම.
- ✳ තම ප්‍රකාශන සඳහා හොඳ වෙළෙඳ පළක් ලබා ගැනීම.
- ✳ ක්ෂෙත්‍රයට අදාළ විවිධ ආයතන හා පුද්ගල සබඳතා ගොඩනගා ගැනීම.
- ✳ ක්ෂෙත්‍රයේ විවිධ කොටස් සඳහා පුහුණු වීම්, වෙනත් ආධාර සහ පහසුකම් ලබා ගැනීම, ආදිය ඉන් කිහිපයකි.

බොලොඤ්ඤා පොත් ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පිළිබඳ මීළඟට සලකා බැලීම සුදුසු යයි සිතමි.

මෙම ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාව පළමු වතාවට සහභාගි වී තිබෙන්නේ 1983 වර්ෂයේදී ය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පළමු වරට සහභාගි වූයේ වර්ෂ 1988 දීය. එම වර්ෂයේ සිට 1989 වර්ෂය හැර සෑම වර්ෂයකදී ම ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන් බොලොඤ්ඤා ළමා පොත් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරති. මේ අතරම, පෞද්ගලික අංශය ද බොහෝ වර්ෂවල දී මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි වේ.

කෙසේ නමුත් 1983 සිට මේ දක්වා වසර දහයක් ශ්‍රී ලංකාව මෙම ප්‍රදර්ශනයට සහභාගි වී ඇති බව පෙනේ. මෙම කාලය තුළ ආයතන දහයක් විවිධ වර්ෂයන්හි දී සහභාගි වී ඇත. එම ආයතන කොටස් තුනකට වෙන් කර දැක්විය හැකිය.

1. රාජ්‍ය ආයතන අතුරින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සහ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.

2. අප රටේ පොත් ක්ෂෙත්‍රයට සම්බන්ධ විවිධ සංගම් අතරින් නිර්මාණ ඇසෝෂියේට්ස් සහ ප්‍රකාශක-වරුන්ගේ සංගම් දෙක.

3. පොත් ක්ෂෙත්‍රයට අදාළ පෞද්ගලික සංවිධාන - දයාවංශ ජයකොඩි

සහ සමාගම, එම්. ඩී. ගුණසේන සහ සමාගම, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සහ ප්‍රදීප ප්‍රකාශකයෝ ය.

මෙම සහභාගිත්වය තුළින් අප අත් කර ගත් ඵලදායි ප්‍රතිඵල අතරට සිබිල් වෙත්තසිංහ මහත්මියගේ "කුඩ හොරා" ළමා පොත ඩෙන්මාර්ක් භාෂාවට පරිවර්තනය වීමත්, එම මහත්මියගේම "දුවන රැවුල" ළමා පොත චීන භාෂාවට පරිවර්තනය වීමත් සඳහන් කළ හැකිය.

අප රටේ දක්ෂ ළමා පොත් කතුවරුන්, දක්ෂ ළමා පොත් චිත්‍ර ශිල්පීන් සිටිති. එහෙත් අපගේ ළමා පොත් ජාත්‍යන්තර ළමා පොත් හා සසඳන කළ පෙනෙන දුර්වලතා කිහිපයකි. මුද්‍රණ කඩදාසිවල තත්ත්වය, චිත්‍ර කළු සුදු රේඛා චිත්‍ර වීම, ළමා මනසට යෝග්‍ය චිත්‍ර අඩු වීම ආදිය ඉන් කීපයකි.

ජාත්‍යන්තර වශයෙන් මෙම ප්‍රදර්ශනයට සහභාගි වීම වැදගත් වේ. එහෙත් හුදෙක් අපගේ ළමා පොත් ප්‍රදර්ශනය කිරීමෙන් පමණක් එම සහභාගිවීමේ ප්‍රයෝජනය ලබා ගත නොහැකිය. සෑම වර්ෂයකම ළමා පොත් සියයක් පමණ ශ්‍රී ලංකා කුටියෙහි ප්‍රදර්ශනය සඳහා තැබේ. එම අදළ වර්ෂයේ දී නිකුත් වූ පොත් මෙන්ම, සමහර ඉතා ජනප්‍රිය එහෙත් වර්ෂ කිහිපයක් පැරණි ළමා පොත් ද මේ අතර වේ.

මෙම වාර්ෂික බොලොඤ්ඤා ළමා පොත් ප්‍රදර්ශනයට සහභාගි වීමෙන් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට නම් ඒ සඳහා පූර්ව සූදානමක් තිබිය යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කරුණු ප්‍රයෝජනවත් වේ යයි සිතමි.

* ළමා ග්‍රන්ථ නාම සියයක් හෝ ආසන්න සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කිරීම. (දැනටමත් මෙය සිදු කෙරේ.)

* පොත් තෝරා ගැනීමේදී වඩා උසස් ගුණාංග සහිත පොත් අවම වශයෙන් දහයක් පමණ තෝරා ගැනීම, වඩා හොඳ තිමාවක් සහිත වීම, ළමා මනසට උචිත චිත්‍ර සහිත වීම, සරල නිවැරදි බස, අන්තර්ජාතික වශයෙන් හෝ කලාපීය වශයෙන් පොදු තේමාවන් සහිත වීම. (ජාතක කතා, ඊසොප්ගේ උපමා කතා ආදිය), භාෂා තුනෙන් ම රචිත පොත් ආදී කරුණු එකක් හෝ කීපයක් අඩංගු පොත්.

* තෝරා ගන්නා පොත් සිංහල හෝ දෙමළ බසින් රචිත නම්, කතාවේ කෙටි ඉංග්‍රීසි පරිවර්තනයක් පොතට අමුණා ප්‍රදර්ශනය කිරීම. කෙටි ගද්‍ය හෝ පද්‍ය කොටස් නම් පිටුවෙන් පිටුව පරිවර්තිත කොටස් ඇමිණීම.

* අරමුණක් සහිත තෝරා ගත් පොත් කීපය පිළිබඳ ව විස්තරයක් සැපයීම. මෙම විස්තරය, ප්‍රදර්ශනයේ දී ප්‍රයෝජනවත් වන ආකාරයට සැකසිය යුතුය. පොතේ පිටකවරයේ චිත්‍රය, මිල, ප්‍රකාශනය, කතුවරයා සහ චිත්‍ර ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් ආදිය මෙයට අඩංගු විය යුතුය.

* රාජ්‍ය අංශයේ සහභාගිත්වය මෙන්ම, ළමා පොත් ක්ෂේත්‍රයෙහි ප්‍රවීණ එක් ශිල්පියෙකුට හෝ ප්‍රදර්ශනයට සහභාගි වීමේ අවකාශයක් ලබා දිය හැකි නම් එය වැදගත් වේ.

* වාණිජ මට්ටමකින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රකාශන පිළිබඳව යම් යම් පූර්ව එකඟවීම් තිබිය යුතුය. පරිවර්තන කාර්යයේදී පැන නැගෙන ප්‍රශ්න, දේශීය ප්‍රකාශකයා පරිවර්තනයෙහි හිමිකම් පැවරීමට සූදානම් ද? ඒ හා සම්බන්ධ කොන්දේසි ආදිය පිළිබඳව පූර්ව නිගමන තිබිය යුතුය. ප්‍රදර්ශනයේ දී යම් ප්‍රකාශනයක් සම්බන්ධව විදේශීය ප්‍රකාශකයා සමඟ සාකච්ඡා කරන්නේ එම ප්‍රකාශනයට සෘජුවම නීතිමය අයිතිය ඇති තැනැත්තෙක් නොවීමට තිබෙන ඉඩ ප්‍රමාණය වැඩිය. එවැනි අවස්ථාවක පැන නැඟෙන ප්‍රශ්න සම්බන්ධව ඔහුට ස්වාධීනව තීරණ ගැනීමට ඉහත සඳහන් පරිදි එම ප්‍රකාශනය සම්බන්ධ ගැටළු නිරවුල්ව තිබිය යුතුය.

* ප්‍රදර්ශනය නිම වී මෙරටට පැමිණි පසු එම සබඳකම් පවත්වා ගැනීම, අපගේ ප්‍රකාශනයක් සඳහා යහපත් ප්‍රතිචාරයක් ලැබිණි නම් එම තත්ත්වය වර්ධනය කර ගැනීම.

* ප්‍රදර්ශනය ඇරඹීමට මසකට, දෙකකට පෙර අපගේ ප්‍රචාරක කටයුතු ඇරඹීම, ප්‍රදර්ශනයට සහභාගි වන සංවිධාන, ප්‍රදර්ශකවරු අතරින් තෝරා ගත් කොටසක් අතර ප්‍රචාරක කටයුතු කිරීම.

අවසාන වශයෙන් සඳහන් කළ යුත්තේ ළමා පොතක් යනු ඉතාමත් අවධානයකින්, මනා අධ්‍යයනයකින් යුතුව එළිදැක්විය යුතු නිර්මාණයක් බවයි. එම නිර්මාණයට දායක වන සෑම කොටසක් තුළම ළමා මනස පිළිබඳ වැටහීමක් තිබීම අත්‍යවශ්‍ය වේ. දරුවාගේ කියවීමේ රුචිය වැඩිවන ආකාරයට, බුද්ධිමත්, යහපත් පුරවැසියෙකු බිහි කිරීමේ කාර්යයට පදනමක් වන අයුරට එම නිර්මාණය සකස් විය යුතුය. මේ නිසාම ළමා පොත් ක්ෂේත්‍රයට සම්බන්ධ ශිල්පීන්ට මනා පුහුණුවක් ද අවශ්‍ය ම වේ. චිත්‍ර නිර්මාණය, රචනය, සංස්කරණය, පොතේ සැකැස්ම, මුද්‍රණය ආදී සෑම අංශයක් ම මෙහිදී වැදගත් වේ.

බොලොඤ්ඤාහි ත්‍යාගලාභී පොත් නැරඹූ විට එම පොත් ළමා මනසට කෙතරම් පහසුවෙන් ග්‍රහණය වේද යන්න පැහැදිලි වේ. මෙම පොත්වල යොදා ඇති වර්ණ සංකලනය තෝරාගත් වර්ණ, තේමාවන්, චිත්‍ර සඳහා දී ඇති ප්‍රමුඛත්වය, ගද්‍ය හා පද්‍ය කොටස් යොදා ඇති ආකාරය තුළින් සාර්ථක ළමා පොතක් පිළිබඳ ව හොඳ වැටහීමක් ලබා ගත හැකිය.

ලාංකික ශිල්පීන්ට ද වඩා හොඳ පුහුණුවක් අවශ්‍ය බව අපිට පෙනී යන කරුණකි. එවැනි පුහුණු මඟින් සැඟවී ඇති දක්ෂතා ඔප ගන්වා ගැනීම මෙන්ම අවශ්‍යතාවය පරිදි දක්ෂතා හැඩගස්වා ගැනීමට ද හැකිය. එවැනි දක්ෂ ශිල්පීන් අතින් බිහිවන නිර්මාණ සඳහා ජාත්‍යන්තර වශයෙන් අවධානය ලබා ගැනීමට ද හැකිය. බොලොඤ්ඤා පොත් ප්‍රදර්ශනය ඒ සඳහා ඉතාම සුදුසු ස්ථානයක් බව අවසාන වශයෙන් සඳහන් කළ හැකිය.

# INFORMATION STORAGE TECHNOLOGIES

**C. I. Karunanayake**
**Addl. Director**
**Centre for Development Information**
**Department of National Planning**

10 FEB 1995

Information storage is an area that has been subjected to revolutionary changes since the last decade. These changes have made a great impact on the today's libraries and information centres. This paper will briefly outline the various forms of storage that have been developed, their applications in libraries and information centres, and the problems facing the new storage technologies.

Following are the main forms of information storage developed as alternatives to the printed word-

**videodisks**
**compact disks (audio) - CD(A)**
**compact disks (interactive) - CD(I)**
**compact disks read only memory - CD(ROM)**
**optical digital disks**
**optical tapes**
**optical cards**

All these forms rely on the use of optically sensitive material to store information and use light generally in the form of lasers, for both recording and reading the material. The processes underlying each form are similar. The differences arise from the ways in which they are developed and marketed for commercial applications.

### Videodisks

Videodisks are the first optical form marketed commercially. They are used mainly for two purposes viz. as a means of publishing and distributing general purpose entertainment programmes such as motion pictures, and as a medium for interaction programmes for training and education etc. On the videodisk all information is recorded in the audio and video format of a standard television signal. It is not limited to moving pictures and sound. All types of information can be mixed on a single disk.

### Major characteristics of videodisks

1. **videodisks are circular platters generally 12" in diameter**
2. **Large storage capacity (54,000 frames per side) Eight hundred million characters of data on one disk**
3. **Information read by a laser beam**
4. **Capable of carrying both video and audio informa tion**
5. **Capable of storing in dividual still frames or motion pictures or both**
6. **Capable of storing both digital and analog data which makes the videodisk extremely flexible (both text and graphics can be stored on the same disk)**
7. **Disks may be controlled by - Player's own on - board computer External computer**
8. **Interactive programme via multi-choice menu or key word search**
9. **Random access**
10. **Dual language capability**
11. **Archive quality**

Access to disks is provided through a microcomputer linked to a videodisk player with monitors. Software is used to provide retrieval access to material on the disks through a microcomputer database.

### Compact disk technology

**Compact disk technology is used in compact disk (audio) CD (A), compact disk (interactive) CD (I), and compact disk read only memory CD (Rom).** The primary application of CD (A) is sound recording. Its technology is same as that for the videodisk with the difference being the nature of the signal recorded. CD (I) contains some of the features of CD (A) and CD (Rom). A single CD (I) disk may contain audio, video, graphics, animation text and computer software. The information is stored in the CD (I) disk along with the necessary software for interactive use. The hardware package would come as a self-contained unit which would include the necessary video and computer components. CD (Rom) is very similar to reflective optical video disk technology. The major difference is that video disks store information in an analog form and compact disks carry data recorded in digital form. The read only memory portion refers to the use of disks as a storage medium for information that cannot be changed once it is recorded. It is a relatively inexpensive method of storing, searching, and retrieving large amounts of information.

**Major features of CD (Rom)**

1. **Storage capacity** : CD Roms have a high storage capacity with low cost per Megabyte. A 12cm. disk has a storage capacity of about 550 Megabytes, the equivalent of 250,000 pages of printed text or the contents of 1,500 floppy disks.
2. As a storage medium CD Rom when physically handled is much more durable than magnetic media. There is no wear on the information surface since it is read by a beam of light only.
3. CD Rom makes it possible to have unlimited searching at a fixed cost (absence of telecommunication charges and search costs).
4. The relatively long life time of CD Rom disks and the nature of digital data storage show that the CD Rom format has considerable advantages in comparison with magnetic media for long term archival storage purposes.
5. CD Rom is a read only medium and an existing disk cannot be updated. The advantage of read only is that data is more secure, and cannot be accidentally erased by anyone accessing it.

A major factor in the adoption of CD Rom technology is the availability of interfaces to link computers and CD Rom drives. CD Rom can be used with all computer systems, but because of its performance characteristics it is expected to be used primarily with microcomputers. One of the drawbacks is the non-availability of a single standard interface. Different CD Rom publishers have developed different interfaces. Similarly device driver software will be required and may be either supplied or specified by the drive manufacturer. The user interface or screen display and retrieval software are other elements in the CD Rom storage unit.

One of the current drawbacks is that CD Rom products now in use provide access to only one user, on one machine, with no remote updating capabilities. To remedy this situation, Silver Platter Information Inc. has introduced a prototype of Multi Platter a multi-user CD Rom system for libraries.

**Optical disk (digital) technology**

Optical disks are special information storage devices which are created and read by laser light. This technology has those attributes which are most important to archival preservation, namely, measurable physical stability, environmental tolerance, copying of stored information without general loss and, most importantly, predictable longevity. Its service features are random accessibility, error correction, digital enhancement, remote sencing and access through telecommunications, on demand display and printing and great storage density. Optical disk technology affords extremly high density storage of information. **A one sided 12" digital disk can store between 10,000 and 20,000 pages of text depending on the resolution required**. This technology represents a potentially efficient and economical way of storing and retrieving text. Optical storage also avoids wear resulting from continuous disk usage, since only a beam of light touches the medium during playback. In addition, information on the digital optical disk can be transferred to a new disk without any loss. It is thus valuable as a preservation format. Together, these strengths make the disk a potential ideal medium for on demand retrieval of high use items.

An optical digital disk's storage and retrieval system includes the following major elements -

**an input system (scanner)**
**an optical disk storage system**
**a processing system : all functions of input and communications are switched through the computer system**
**an output system: terminal for multi user access**
**a high speed printer**

Documents are scanned into magnetic disk and stored for quality review and then they are on written to optical disk. The disks will be stored in a storage unit (juke box).

Optical cards are another form developed by computer manufacturers in recent years. These are still in the stage of development. **The best developed prototype, the Drexler Laser Card, is the size of a credit card and holds up to 2 MB (read only version) or 4 MB (write once) of information.** Another card with considerable potential is the Hi Lite Optical Card developed by Optical Recording Corporation (ORC) in Toronto. ORC has projected that it will have a capacity of up to 200 MB with access time of about 0.5 seconds.

Optical disks are write once devices with no erasability and this is regarded as a major shortcoming. At present a number of companies are researching the development of erasable optical disks. Non erasability has advantages for applications such as archival storage and massive data collection jobs, where there is more need to preserve information than to erase and update it.


BL 3269

**Library Applications:**

These technologies not only offer new opportunities for extending current developments in computer based information delivery but also provide solutions to long-standing management problems facing major libraries. The emergence of new forms of storage has widened the responsibilities of libraries in the collection and storage of, and the provision of access to, information produced in these forms.

Storage space is one of the management problems faced by research libraries. One approach to this problem of storage is the digitalisation of material on the optical disk which will ultimately provide a fast convenient delivery of material.

Preservation and conservation are other important aspects. The material in a library collection deteriorates over time. It occurs due to wear and tear through normal use, environmental damage and effects of the acidity of the paper. The two methods of preservation currently used within the library community are mass deacidification and microfilming of selected books.

However if optical storage is substituted for microfilming and deacidification it will make the material more accessible. Space for storage is reduced and the material is in a form that permits direct delivery to end users. Rare material can be distributed by publication on videodisk or CD/Rom. Examples of such usage can be drawn from the Library of Congress optical disk project.

**In 1982 L.C.began an optical disk pilot project to explore the potental of optical storage media for library preservation, storage, and service applications.** The project is in two parts; print and nonprint. The nonprint project uses analog videodisk technology and compact audio disks to store still and motion pictures and the collection of prints and photographs. Preservation is the major focus of the project through it has also experimented with ways of providing greater research access to special material. The aim of the print project is to preserve the intellectual contents of fragile, rare and frequently used items and other items. In this digitized images of print materials are stored in optical digitalised disks.

Improved access to material is another advantage offered by these new forms of storage. The forms have potential for improving the service to on-site users, such as providing multiple copies of the material for in house use, and making them available in several locations, more than one user can access an item at the same time, and unrestricted access can be provided to material which would otherwise require special security precautions.

**The Library of Congress optical disk project** provides more extensive and more convenient access to special and rare material. The National Library of Medicine, U.S.A., produced an experimental interactive videodisk programme to library collections for direct users, and several instructional video disks on medical pathology, radiology and dental technology. **The National Library of Agriculture** (USA) uses video disk technology for storage and dissemination of full text databases on agriculture. The Nuclear Regulatory Commission of the United States of America has developed a micro computer based optical disk storage system which provides the user with a capability for combined full text search and image retrieval of documents relating to nuclear waste management programmes. One of the objectives of the video disks project of the National Library of Canada is the use of video disks as a practical research tool for Canadian studies.

**The major areas of application of CD Rom in libraries are cataloguing support, on-line public access catalogues, and collection, development, and reference support.** Catalogue aids consist of large databases (in excess of 2 million records) of MARC records which, with software, allow the user to modify existing records and, in some cases, do original cataloguing as well.

Products of this category include **Bibliofile** (from the Library Corporation), **Discon** (Utlas International), **Laserquest** (General Research Corporation), and **Lasercat** (Western Library Network).

Reference and research products on CD Rom are versions on existing on-line data bases. Several of these databases are available from more than one CD Rom vendor.

| Database | Vendor |
|---|---|
| Agricola | OCLC, Silver Platter |
| Medline | BRS, Cambridge Sci entific Abstracts, Dialog, EBSCO, Silver Platter |
| NTIS | OCLC, Silver Platter |
| LISA | Silver Platter |

The **H.W. Wilson Company** has made all its on-line databases available on CD Rom. Examples of more traditional reference and research tools on CD Rom are

**Encyclopaedias**

Grolier's Academic American Encyclopaedia Mc. Graw Hill's CD Rom Science and Technology. Reference set (Concise Encyclopaedia of Science and Technology and Dictionary of Scientific and Technology terms)

**Dictionaries**

Oxford English Dictionary. Facts on File

**Newspapers**

Information access: Info Trac II

The applications of optical cards include electronic publishing records keeping software distribution. The experiences with both digital video disk and CD Rom technology has demonstrated that optical technology has tremendous potential in the libraries of the future in terms of both preservation of materials and enhanced access to those materials. Several problems have arisen due to the development of new technologies in information storage.

**Copyright is one of the problems encountered in this regard**. The optical disk project of the Library of Congress raises important copyright issues, where users are provided with the facility of doing full-text searches and obtaining printouts. In the nonprint project the Copyright Office has determined that material with valid copyright may not be displayed to the public without the permission of copyright holders. The Library of Congress has established advisory groups to address copyright and other issues of importance to the publishing, information, and library communities.

**Lack of standardisation is another problem faced in most of these new storage technologies**. CD Rom standards are being developed by a number of national and international committees. There is also considerable opposition to this work from people who fear that adoption of standards will restrict technological advances and inhibit innovation. A problem for CD Rom users has been the lack of standardization. Standidized formats mean that any CD Rom disk medium would work on any CD Rom drive, so that users could invest in a single drive system and have reasonable confidence that any CD Rom disk would work on that hardware. CD Rom disk manufacturers adhere to what has become the industry standard for CD Rom disk production. This includes disk size, placement of data on the disk, and how information is retrieved from the disk. Total interchangeability will not be achieved though, until hardware and operating/interfacing systems have also been commonly agreed upon. **The National Information Standards organization of National Bureau of Standards** (USA) has been in the process of working out standards for the use and production of CD Rom equipment and software. The standards deal with volume and file structures, where information is located on each disk, and how that information is addressed by the computer. The European Computer Manufacturers Association has proposed a similar data structure standard to the **International Standards Organization.**

New storage technologies must be affordable and cost effective to succeed beyond the experimental stage. This means that not only must the costs of the new technology compare favourably with the existing solutions but also that the technology must be priced to permit gradual introduction. The two greatest cost factors are in the scanning and in the delivery system. Scanning is labour intensive and the scanners require manual feeding. Quality control checks and investments in multiple micro work stations make start up costs high. It is said that as the cost of optical equipment continues to decrease, and with greater demand and production, the cost of a small storage retrieval system is likely to fall to the same price level as a minicomputer system within the next 5 years. The costs of CD Rom drives are dropping rapidly but subscriptions are high.

Standardised search software is not available. Different products use different software, making it difficult for a library to provide access to all the databases it wants. Irregularity in updating is another drawback. Most of the disk updates are sent monthly, quarterly or yearly. Therefore the information is not usually as current as can be obtained from corresponding on-line products.

There are some non-technological barriers to the promotion of new technologies. The economic structure of the publishing industry is not yet prepared to cope with the change. There is great psychological resistance to the elimination of paper and distrust in the reliability of electronic and optical storage as an archival medium by both libraries and library users. Although they talk about paperless libraries as a means of placing most kinds of information in a user's hands, paper continues to be very much in use.

# පුස්තකාල සංරක්‍ෂණ මධ්‍යස්ථාන

පුස්තකාලවල ඇති පොත්පත් ස්වභාවික හේතූන් නිසාත්, කෘමි උවදුරු නිසාත්, පාඨකයින්ගේ පරිහරණය නිසාත් අබලන්වීම සහ උපද්‍රවවලට ලක්වීම පුස්තකාලවලට ඇති ප්‍රධාන ගැටළුවක් වී තිබේ. මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණය හා ආරක්‍ෂණ කටයුතු පුස්තකාලවල ප්‍රධාන වගකීමක් වශයෙන් අද ලොව පුරා පිළිගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණ වැඩ සටහනක් 1993 වසරේදී පුස්තකාල සේවා මණ්ඩලය ක්‍රියාත්මක කරන ලදී. මෙම ලිපිය එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලියැවුනකි.

පුස්තකාලවල ඇති පොත්පත් ස්වභාවික හේතූන් නිසාත්, කෘමි උවදුරු නිසාත්, පාඨකයින්ගේ පරිහරණය නිසාත් අබලන්වීම සහ උපද්‍රවවලට ලක්වීම (දැනට ශ්‍රී ලංකාවේ) පුස්තකාලවලට ඇති ප්‍රධාන ගැටළුවක් වී තිබේ. විශේෂයෙන්ම සර්ම කලාපීය දේශගුණයක් ඇති ශ්‍රී ලංකාව වැනි රටවල පොත්පත් ස්වභාවික දේශගුණික තත්ත්වයන්ගෙන් හානි පැමිණේ. බොහෝ පුස්තකාලවල පොත්පත් තැන්පත් කරන ප්‍රදේශ කාවුන් වැනි කෘමි උවදුරුවලින් ගහන වී ඇති අතර, එම සතුන්ගෙන්ද පොත්පත්වලට හානි පැමිණේ. දීර්ඝ කාලයක් තිස්සේ පාඨකයින් විසින් පරිහරණය කිරීම මෙන්ම, ඇතැම් සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන පාඨකයින් උවමනාවෙන් පොත්පත් කඩා දැමීම ද දැනට ඇති තවත් ප්‍රධාන උපද්‍රවයන් වේ. අප රටේ පොත්පත් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන කඩදාසි බොහෝ අවස්ථාවල උසස් තත්ත්වයක නොපැවතීම මෙහිදී බලපාන තවත් ගැටළුවකි. සංවර්ධනය වූ ඇතැම් රටවල ග්‍රන්ථ නිෂ්පාදනය සඳහා ආම්ලිකතාවය අඩු උසස් මට්ටමේ කඩදාසි භාවිතා කළද, එබඳු පියවරක් ගැනීමට ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල මෑත අනාගතයේදී ද හැකිවේ යයි සිතීම අපහසුය. අද බොහෝ පොත්පත් මුද්‍රණය වනුයේ සාමාන්‍ය කඩදාසිවලටද වඩා බාල කඩදාසියේ වීම කණගාටුදායක තත්ත්වයකි. මෙබඳු කඩදාසිවලින් මුද්‍රිත පොත්වල ආයු කාලය කෙටි වන අතර, ඉක්මනින් උපද්‍රවවලට ලක්වීමට ඇති ඉඩකඩ ද වැඩි වේ. මේ සියළුම හේතූන් නිසා තම තමන්ගේ පුස්තකාලවල ඇති පොත්පත් එකතුන් රැක ගැනීම සඳහා පුස්තකාලයාධිපතිවරුන්ට විශාල ප්‍රයත්නයක් දැරීමට සිදුවී තිබේ. දැනට සොයා ගෙන ඇති තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පොත්පත් වලින් බොහොමයක් ඉතා කෙටි ආයුෂයක් සහිතව ඉක්මණින් විනාශ වී යන බව පෙනී ගොස් තිබේ. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට ඇතිවී ඇති පාඩුව ඉතා විශාල වේ. පුස්තකාල සඳහා වෙන්වන සීමිත මුදල් නැවත නැවතත් එකම වර්ගයේ පොත්පත් ලබාගැනීමට යෙදවීමට පුස්තකාලයාධිපතිවරුන්ට සිදුවී ඇත.

මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණය හා ආරක්‍ෂණ කටයුතු පුස්තකාලවල ප්‍රධාන වගකීමක් වශයෙන් අද ලොව පුරා පිළිගෙන තිබේ. සෑම ප්‍රධාන පුස්තකාලයකම පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයක් තිබීම දියුණු පුස්තකාල සේවාවන් ඇති රටවල දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණයකි. එමගින් පුස්තකාලවලට අළුත් පොත්පත් ලැබුණු විගසම ඒවා ධූමායනය, බැඳීම ආදිය මගින් සංරක්‍ෂණය කළ හැකිවනවා මෙන්ම කෘමි උවදුරුවලින් හා වෙනත් ආපදාවලින් පොත්පත්වලට හානි පැමිණීම ඇරඹුණු විගසම ඒවාට ප්‍රතිකර්ම කිරීමට හැකියාවක් ද තිබේ. මෙම පියවරයන් නිසා එබඳු සංරක්‍ෂණ අංශ ඇති පුස්තකාලවල පොත්පත් හොඳ තත්ත්වයක වඩා දිගු කාලයක් තබා ගැනීමටත්, පාඨකයින් සඳහා වැඩි සේවයක් කරලීමටත්, පුස්තකාල සඳහා වන වැය අඩු කරලීමටත් හැකිවී තිබේ.

ශ්‍රී ලංකාව පුරා විවිධ වර්ගවල පුස්තකාල රාශියක් තිබුණ ද, එම පුස්තකාලවල පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණ අංශ ඇත්තේම නැති තරම් වේ. ප්‍රධාන නගර කිහිපයක මහජන පුස්තකාල දෙක තුනක හැර වෙන කිසිදු මහජන පුස්තකාලයක සංරක්‍ෂණ අංශ දැනට නොමැති අතර, පොත් බැඳීම වැනි සංරක්‍ෂණ ක්‍රම කිහිපයක් හැර පුළුල් සංරක්‍ෂණ අංශයක් කිසිදු පුස්තකාලයක නොමැති බව පෙනේ. පාසල්, පිරිවෙන් සහ ග්‍රාමීය මට්ටමේ පුස්තකාලවල සංරක්‍ෂණ අංශ ඇත්තේම නැත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මෙම සංරක්‍ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ මෙතෙක් පැවති මෙම අඩුපාඩු මග හරවා ගැනීමේ මාර්ගයක් වශයෙනි. මෙම වැඩසටහනේ ආරම්භයක් වශයෙන් දිවයින පුරා ප්‍රධාන මහජන පුස්තකාල 36 ක සංරක්‍ෂණ මධ්‍යස්ථාන ආරම්භ කරණු ලැබේ. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේත්, අදාළ මහජන පුස්තකාල සම්බන්ධ පළාත් පාලන ආයතනයේත් ඒකාබද්ධ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වේ. පුස්තකාල සේවා මණ්ඩලය විසින් සංරක්‍ෂණ මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ප්‍රධාන උපකරණ කට්ටලය සහ එම සංරක්‍ෂණ මධ්‍යස්ථානය භාරව ක්‍රියා කිරීමට පත්කර ඇති පුස්තකාලයාධිපතිවරයාට ඒ පිළිබඳ පුහුණුවක් ලබාදීම ද කරණු ලබයි. අදාළ පළාත් පාලන ආයතනය මෙම සංරක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා තම පුස්තකාලයේ හෝ ඊට ආසන්න ගොඩනැගිල්ලක ඉඩ පහසුකම් සපයාදීම, එම කාර්යය සඳහා ස්ථිර නිලධාරියෙකු

පත් කිරීම, සංරක්ෂණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම සඳහා වාර්ෂික මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සහ වෙනත් පහසුකම් සැපයීම යන කාර්යයන් ඉටු කෙරේ.

මෙම සංරක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂෙත්‍රයේ මෙතෙක් ආරම්භ කරන ලද ප්‍රධානම සංරක්ෂණ ව්‍යාපෘතිය ලෙස සඳහන් කළ හැක. මේ මගින් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ වැදගත්කම ගැන පුස්තකාලයාධිපතීන්, පුස්තකාල අධිකාරිය හා පාඨකයින් අවබෝධයක් හා උනන්දුවක් ඇති කරණු ලබයි. මෙම සංරක්ෂණ මධ්‍යස්ථානවල වගකීම හා කාර්යභාරය දෙයාකාර වේ. තම පුස්තකාලයේ ඇති පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීම වේ. අනෙක් ප්‍රධාන වගකීම වනුයේ එම පුස්තකාලය ආසන්නයේ ඇති අනෙකුත් පුස්තකාලවල සංරක්ෂණ කටයුතු ඉටුකරලීම වේ. වෙනත් පුස්තකාලවල පොත්පත් බැඳීම හෝ වෙනත් අදාළ සංරක්ෂණ කටයුතු වාණිජ පදනමක් මත ඉටු කළ හැක. ඒ අනුව පොත් බැඳීම හා වෙනත් අදාළ කාර්යයන් සඳහා අදාළ පුස්තකාලවලින් මුදල් අය කෙරේ. මේ අනුව මෙම සංරක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය හොඳින් ක්‍රියාත්මක වුවහොත් අදාළ පළාත් පාලන ආයතනයට එය හොඳ ආදායම් මාර්ගයක් ද වනු ඇත. ඒ ඒ ප්‍රදේශවල පුස්තකාල කමිටු වල අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය වශයෙන් පුස්තකාල අතර සබඳතාවය තහවුරු කිරීමට මෙම ව්‍යාපෘතිය තවදුරටත් හේතුවනු ඇත. පොත් බැඳීම වැනි කාර්යයන් සඳහා ඇණවුම් පුළුල් වශයෙන් ලැබෙන විට එම කටයුතු සඳහා ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහය ලබා ගැනීමට මෙම මධ්‍යස්ථානයට හැකියාව තිබේ. ඒ සඳහා අවශ්‍ය මූලික පුහුණුවක් ඔවුන්ට ලබා දුන් විට සංරක්ෂණ මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ පොත් බැඳීම ස්වයං රැකියා ව්‍යාපෘතියක් වශයෙන් ව්‍යාප්ත කිරීම අපහසු නොවේ.

මේ අනුව මෙම පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පුස්තකාල ක්ෂෙත්‍රයේ ඉතා වැදගත් ව්‍යාපෘතියක් ලෙස හැඳින්විය හැක. එක් අතකට ඒ මගින් පුස්තකාලවල පොත්පත් ආරක්ෂා කරලීම නිසා විශාල මුදල් ප්‍රමාණයක් අදාළ ආයතනවලටත්, රටටත් ඉතිරි කර දේ. අනෙක් අතට මේ මගින් පුස්තකාල, ස්වයං රැකියා අවස්ථා සලසා දෙන ප්‍රදේශයේ සමාජීය හා ආර්ථික කටයුතුවලට සම්බන්ධ වන ආයතන ලෙස පුස්තකාල පොදු ජනතාවට වඩා සමීප ආයතනයක් බවට පත්වීමක් සිදුවේ.

ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ සංවර්ධනය වන රටවල පුස්තකාල ක්ෂෙත්‍රයේ ප්‍රධානතම ගැටළුවක් වනුයේ, පුස්තකාල සඳහා අවශ්‍ය පමණ මුදල් ප්‍රතිපාදන හිඟ වීමයි. එබැවින් ලැබෙන සීමිත මුදල් ප්‍රතිපාදන ඉතා ප්‍රවේශමෙන් අත්‍යාවශ්‍ය පොතපත ලබා ගැනීම සඳහා වැය කිරීමට සිදුවේ. එම පොත්පත් හොඳින් රැක ගැනීම පුස්තකාලය සඳහා මුදල් ඉතිරි කිරීමක් වේ. එය පුස්තකාල සේවාවේ ඉතා වැදගත් දූරදර්ශී පියවරක් බව සඳහන් කළ යුතුවේ.

**මහජන පුස්තකාල ආශ්‍රිතව පිහිට වූ සංරක්ෂණ මධ්‍යස්ථාන 1993**

| | | | |
|---|---|---|---|
| අම්බලන්තොට ප්‍රාදේශීය සභාව | - අම්බලන්තොට | බණ්ඩාරවෙල නගර සභාව | - බණ්ඩාරවෙල |
| අම්බලන්ගොඩ නගර සභාව | - අම්බලන්ගොඩ | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | - බඩල්කුඹුර |
| ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | - ඇල්පිටිය | බද්දේගම ප්‍රාදේශීය සභාව | - බද්දේගම |
| ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | - ඇහැලියගොඩ | බදුල්ල මහ නගර සභාව | - බදුල්ල |
| කඩුගන්නාව නගර සභාව | - කඩුගන්නාව | මතුගම ප්‍රාදේශීය සභාව | - මතුගම |
| කඩුවෙල ප්‍රාදේශීය සභාව | - කඩුවෙල | මාතර නගර සභාව | - මාතර |
| කළුතර නගර සභාව | - කළුතර | මහ නගර සභාව | - මාතලේ |
| කන්නන්විල ප්‍රාදේශීය සභාව | - කන්නන්විල | මීගමුව නගර සභාව | - මීගමුව |
| කැකිරාව ප්‍රාදේශීය සභාව | - කැකිරාව | මුලටියන ප්‍රාදේශීය සභාව | - මුලටියන |
| කුරුවිට ප්‍රාදේශීය සභාව | - කුරුවිට | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව | - රුවන්වැල්ල |
| කුරුණෑගල නගර සභාව | - කුරුණෑගල | වත්තල නගර සභාව | - වත්තල |
| කුලියාපිටිය නගර සභාව | - කුලියාපිටිය | වාරියපොළ ප්‍රාදේශීය සභාව | - වාරියපොල |
| ගම්පොල නගර සභාව | - ගම්පොල | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව | - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| ගාල්ල මහ නගර සභාව | - ගාල්ල | සීතාවකපුර නගර සභාව | - සීතාවකපුර |
| තමන්කඩුව ප්‍රාදේශීය සභාව | - තමන්කඩුව | හම්බන්තොට නගර සභාව | - හම්බන්තොට |
| පදවිය ප්‍රාදේශීය සභාව | - පදවිය | හලාවත නගර සභාව | - හලාවත |
| පුත්තලම නගර සභාව | - පුත්තලම | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව | - හිඟුරක්ගොඩ |
| | | හොරණ නගර සභාව | - හොරණ |

ON EXCHANGE
NATIONAL LIBRARY
SRI LANKA






අතිගරු ජනාධිපති ඩී.බී. විජේතුංග මැතිතුමා විසින් කුලියාපිටියේ අයි.ඇම්.ආර්.ඒ. ඊරියගොල්ල අනුස්මරණ පුස්තකාලය විවෘත කිරීම.
கௌரவ ஜனாதிபதி டீ.பி. விஜேதுங்க அவர்கள், ஐ.எம்.ஆர்.ஏ. ஈரியகொல்ல ஞாபகார்த்த நூலகத்தை திறந்து வைத்தல்.
Opening of the I.M.R.A. Irriyagolla Memorial Library by His Excellency President D.B. Wijetunga
1993.12.04



ISSN සම්මන්ත්‍රණය - සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීම.
ISSN மாநாடு - குத்துவிளக்கேற்றுதல்
Seminar on ISSN - Lighting of the traditional oil lamp.
1993.11.25




අළුතින් ඉදිකරන ලද ලයනල් ජයතිලක අනුස්මරණ පුස්තකාලය,
කුලියාපිටිය, ප්‍රාදේශීය සභාව.
புதிதாக நிர்மாணிக்கப்பட்ட லயனல் ஜயத்திலக்க ஞாபகார்த்த நூலகம்,
குளியாபிட்டிய, பிரதேச சபை.
Newly built Lionel Jayatilaka Memorial Library, Kuliyapitiya.
Pradeshiya Sabhawa.



යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුස්තකාල කමිටුව මගින් පිහිටුවන ලද 'දැනුම' සංවර්ධන අරමුදලේ ඉතිරිකිරීමේ ගිණුම් පොත එහි සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියට භාරදීම.
யட்டிநுவர பிரதேச சபையின் கௌரவ தலைவரினால் அறிவு அபிவிருத்தி நிதிக்கான சேமிப்புப் புத்தகம்.
The President of the Yatinuwara Pradeshiya Sabhawa is handing over the Savings Account Book of the "Danuma Fund" to the Librarian of the Yatinuwara Public Library. This fund has been initiated by the Library Committee.
1993.09.30

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/10

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : [signature]

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*